# කාර්යසාධන වාර්තාව 2024

# වැය ශීර්ෂ අංකය - 238

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01

# පටුන


**1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........ 5**

1.1 හැඳින්වීම ........ 6

1.2 දැක්ම හා මෙහෙවර ........ 6

1.3 අරමුණු හා කාර්යයන් ........ 6

1.4 සංවිධාන සටහන ........ 7

**2.0 ප්‍රගතිය, අභියෝග හා ඉලක්ක ........ 8**

2.1 සමාලෝචනය ........ 9

2.2 බදු ප්‍රතිපත්ති සංස්කරණය ........ 13

2.3 රාජ්‍ය ආදායම් කාර්යසාධනය ........ 15

2.4 අභියෝග හා අනාගත ඉලක්ක ........ 36

**3.0 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍යකාර්ය සාධනය ........ 37**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........ 38

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 41

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 42

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 43

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 44

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 44

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදනය කරන ලද ප්‍රතිපාදන ........ 44

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 45

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ........ 46

**4.0 කාර්ය සාධන දර්ශක ........ 53**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........ 54

**5.0 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්යසාධනය ........ 58**

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු ........ 59

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........ 60

**6.0 මානව සම්පත් පැතිකඩ ........ 61**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 62

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න. ........ 62

6.3 මානව සම්පත් සංවර්ධනය ........ 62

**7.0 අනුකූලතා වාර්තාව ........ 68**

# 01 වන පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# 1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වනුයේ අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ සහ පෞද්ගලික අංශය සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ මූල්‍ය විශ්ලේෂණය හා දේශීය සහ විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදුකිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමයි.

## 1.2 දැක්ම හා මෙහෙවර

දැක්ම

''තිරසර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම සහතික කිරීම.''

මෙහෙවර

''රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.''

## 1.3 අරමුණු හා කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මධ්‍යකාලීන මූල්‍ය රාමුව සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තීරුබදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හැර බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණපනත් සම්පාදනය කිරීම.
- ආදායම් රැස්කරන සියළුම දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් රාජ්‍ය ආදායම සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය කිරීම.
- ආදායම් රැස්කරන දෙපාර්තමේන්තු හා ජාතික අයවැය සහ මූල්‍ය ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
- රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට අනුව නීතිමය සංශෝධන කිරීමට අදාළ කටයුතු ක්‍රියාවට නැංවීම.
- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.
- සාර්ව ආර්ථික ඒකකයේ සහාය ඇතිව විවිධ රාජ්‍ය මූල්‍ය සහ සාර්ව ආර්ථික ක්‍රියා විශ්ලේෂණය සහ පර්යේෂණ සිදුකිරීම.
- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, පනත් සංශෝධනය හා ගැසට් නිවේදන පිළියෙල කිරීම.

## 1.4 සංවිධාන සටහන




| | | |
|---|---|---|
| අතිරේක අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| නි.අ. | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස.අ. | - | සහකාර අධ්‍යක්ෂ |
| ප.නි. | - | පරිපාලන නිලධාරී |
| භාෂා. පරි. | - | භාෂා පරිවර්තක |
| සං.නි. | - | සංවර්ධන නිලධාරී |
| ප්‍ර.ක.සේ.නි. | - | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| ක.සේ.නි. | - | කළමනාකරණ සේවා නිලධාරී |
| කා.සේ.සේ. | - | කාර්යාල කාර්ය සහායක |

# 02 වන පරිච්ඡේදය

## ප්‍රගතිය, අභියෝග හා ඉලක්ක

## සමාලෝචනය

2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදයෙන් අනතුරුව අඛණ්ඩව වසර දෙකක් මුළුල්ලේ ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කිරීමත් සමඟ රාජ්‍ය මූල්‍ය අංශය අත් කරගත් ඉහළ කාර්යසාධනය 2024 වසරේ දී ශ්‍රී ලංකාව ළඟා කරගත් ආර්ථික ස්ථාවරත්වය සඳහා ප්‍රධාන වශයෙන්ම දායක විය. 2022 වසරේ දී රජයේ බදු ආදායම ඓතිහාසික මෙන්ම ගෝලීය වශයෙන් අවම අගයක් වූ දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි. යෙන්) සියයට 7.3 දක්වා පහත වැටීම හේතුවෙන් අයවැය හිඟය පුළුල් වීම ආර්ථික අර්බුදය සඳහා බලපෑ ප්‍රධානතම හේතුවක් විය. රජය විසින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද දැඩි ක්‍රියාමාර්ග සහ වියදම් තාර්කිකකරණය කිරීම සඳහා ක්‍රියාවට නංවන ලද ප්‍රයත්නයන්ගෙන් ප්‍රතිලාභ ලබමින්, 2023 වසරේ දී රු. බිලියන 173.3 ක් එනම් ද.දේ.නි.යෙන් සියයට 0.6 ක් වූ ප්‍රාථමික අතිරික්තය 2024 වසරේ දී රු. බිලියන 649.6 ක් එනම් ද.දේ.නි.යෙන් සියයට 2.2 ක් දක්වා වර්ධනය වීමත් සමඟ රාජ්‍ය මූල්‍ය අවකාශය තවදුරටත් පුළුල් විය. 2024 වසරේ දී ප්‍රාථමික අතිරික්තය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ නියම කර ඇති රු. බිලියන 300 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කය ඉක්මවා යන ලදී. .

2023 වසරේ අග භාගයේ සිට රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රයත්නයන්හි ද, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය වීමෙහි ද සාධනීය ප්‍රතිඵල පිළිබිඹු කරමින් 2024 වසරේ දී, ප්‍රදාන ද ඇතුළු රජයේ සමස්ත ආදායම, නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එබැවින්, 2024 වසරේ දී ප්‍රදාන ද ඇතුළුව රජයේ සමස්ත ආදායම, වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 99.1 ක් ළඟා කරගෙන ඇති අතර එය ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ඉතිහාසය තුළ ඓතිහාසික වශයෙන් වාර්තා කරන ලද ඉහළම අගය විය. ප්‍රදාන ද ඇතුළුව රජයේ සමස්ත ආදායම නාමික වශයෙන් 2023 වසරේ දී වූ රු.බිලියන 3,074.3 සිට 2024 වසරේ දී රු. බිලියන 4,090.8 දක්වා සියයට 33.1 කින් වර්ධනය විය. ප්‍රදාන හැර රජයේ ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 3,048.8 සිට 2024 වසරේ දී රු. බිලියන 4,030.8 දක්වා සියයට 32.2 කින් වැඩි විය.

එසේම, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස ප්‍රදාන ද ඇතුළු රජයේ ආදායම, 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව සියයට 0.6 කින් ඉක්මවා යමින් 2023 වසරේ දී වූ සියයට 11.2 සිට 2024 වසරේ දී සියයට 13.7 දක්වා වර්ධනය විය. බදු නොවන ආදායම සියයට 0.1 කින් පහළ ගිය ද, ද. දේ. නි. යට බදු ආදායම දක්වන අනුපාතය ප්‍රතිශතාංක 2.5 කින් සියයට 12.4 දක්වා ඉහළ යාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2024 වසරේ දී ද. දේ. නි. යේ ප්‍රතිශතකයක් ලෙස බදු ආදායම 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව වන සියයට 12.1 ප්‍රතිශතාංක 3.0 කින් ඉක්මවා යන ලදී. එය 2015 සහ 2019 කාලය අතර පූර්ව වසංගත වසර පහෙහි සාමාන්‍යය අගය වූ සියයට 11.4 ට වඩා ඉහළ අගයක් විය. 2024 වසරේ දී ද. දේ. නි.යට බදු ආදායම දක්වන අනුපාතය වර්ධනය වීම සඳහා බදු පදනම් පුළුල් කිරීම, බදු අනුකූලතාවය සහ ආදායම් පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයන් ඇතුළුව රජය මගින් රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම ප්‍රතිශතාංක 2.2 කින් වර්ධනය වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම ආදිය හේතු විය. ද.දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස ප්‍රදාන හැර රජයේ ආදායම 2024 වසර සඳහා අපේක්ෂිත වාර්ෂික ඇස්තමේන්තුව වූ සියයට 13.0 ප්‍රතිශතාංක 0.5 කින් ඉක්මවා යමින් 2023 වසරේ දී වූ සියයට 11.1 සිට 2024 වසරේ දී සියයට 13.5 දක්වා ප්‍රතිශතාංක 2.4 කින් වර්ධනය විය.

ඉතිහාසයේ ප්‍රථම වතාවට, ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු.බිලියන 911.4 සිට 2024 වසරේ දී රු.

වගුව 2.1 | රාජ්‍ය ආදායම් සාරාංශය

රු. මිලියන

| අයිතමය | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **1,463,810** | **2,012,589** | **3,074,324** | **4,090,808** |
| **මුළු ආදායම** | **1,457,071** | **1,979,184** | **3,048,822** | **4,030,838** |
| බදු ආදායම | 1,298,019 | 1,751,132 | 2,720,563 | 3,704,577 |
| ආදායම් බදු | 302,115 | 534,021 | 911,355 | 1,026,199 |
| භාණ්ඩ හා සේවා මත බදු | 646,068 | 875,995 | 1,420,089 | 2,200,890 |
| විදේශ වෙළෙඳාම මත බදු | 349,836 | 341,116 | 389,118 | 477,488 |
| බදු නොවන ආදායම් | 159,052 | 228,052 | 328,259 | 326,261 |
| **ප්‍රදාන** | **6,740** | **33,405** | **25,502** | **59,970** |
| **ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස** | | | | |
| ආදායම සහ ප්‍රදාන | **8.3** | **8.4** | **11.2** | **13.7** |
| **මුළු ආදායම** | **8.3** | **8.2** | **11.1** | **13.5** |
| බදු ආදායම | 7.4 | 7.3 | 9.9 | 12.4 |
| බදු නොවන ආදායම | 0.9 | 0.9 | 1.2 | 1.1 |
| ප්‍රදාන | **0.04** | **0.1** | **0.1** | **0.2** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

බිලියන 1,026.2 දක්වා ළඟා වෙමින් රු. ට්‍රිලියනය ඉක්මවා යන ලදි. මෙම කාර්යසාධනය, ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා වන ප්‍රයත්නයන්හි සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් පසුගිය වසරට සාපේක්ෂව සියයට 12.6 ක වර්ධනයක් සහ 2024 වසර සඳහා වූ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 95.0 ක ළඟා කර ගැනීමක් පිළිබිඹු කරයි. මෙම ඉහළ කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ආදායම් බදු පදනම සැළකිය යුතු ලෙස පුළුල් වීම සහ රාජ්‍ය ආදායමෙහි කාර්යක්ෂමතාව වර්ධනය වීම කෙරෙහි බලපෑ, 2023 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දුන් පුළුල් බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මාලාවය. මෙම ප්‍රතිසංස්කරණ මගින් වඩාත් ප්‍රගතිශීලී, සරල කරන ලද සහ නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට හැකි ආදායම් බදු ක්‍රමයක් කරා ප්‍රවිෂ්ට වීම සඳහා වන ක්‍රමෝපායික ප්‍රවේශයේ සැළකිය යුතු පරිවර්තනයක් පෙන්නුම් කරයි. ආදායම් කාර්යසාධනයෙහි කැපී පෙනෙන වර්ධනය මගින් බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වර්ධනය වීම සහ බදු පරිපාලන කාර්යක්ෂමතාවය වර්ධනය වීම පිළිබිඹු වන අතර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ දී ප්‍රවේශමෙන් සැලසුම් කරන ලද බදු ප්‍රතිපත්තියෙහි තීරණාත්මක කාර්යභාරය අවධාරණය කරනු ලබයි. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2024 වසර තුළ දී 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම්වල සම්පූර්ණ බලපෑම ළඟා කර ගැනීම, රාජ්‍ය හා පෞද්ගලික අංශවල වැටුප් ඉහළ නැංවීම සහ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම ආදිය වේ.

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 694.5 සිට 2024 වසරේ දී රු. බිලියන 1,309.7 දක්වා සියයට 88.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වෙමින් ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. ට්‍රිලියනය ඉක්මවා යන ලදී. 2024 වසරේ දී රාජ්‍ය ආදායම් සඳහා එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, නාමික වශයෙන් විශාලතම දායකත්වය දැක්වීය. දේශීය ක්‍රියාකාරකම් මත වන එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 469.1 සිට 2024 වසරේ දී රු. බිලියන 712.2 දක්වා සියයට 51.8 කින් වර්ධනය වී ඇති අතර ආනයන මත වන එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 225.4 සිට 2024 වසරේ දී රු. බිලියන 597.5 දක්වා සියයට 165.1 කින් වර්ධනය විය. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බද්ද සඳහා වන බදු අනුපාතය ඉහළ නැංවීම, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම සහ එකතු කළ අගය මත බද්ද සඳහා බලපෑ නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් ඉවත් කිරීම සහ ආනයන සීමා කිරීම් ක්‍රමයෙන් ඉවත් කිරීම ය. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් තිබියදී වුව ද, මෙම වර්ධනය 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 93.5 ක් පමණක් නියෝජනය කළ අතර, එයින් පැහැදිළි වන්නේ සාධනීය මට්ටමේ කාර්යසාධනයක් පැවතුනේ වුවද, ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා තවමත් යම් ඉඩ ප්‍රස්තාවක් පවතින බවයි. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමේ සුවිශේෂී වර්ධනය මගින් සාර්ව ආර්ථිකය පුළුල් ලෙස යථාවත් වීම සහ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම වැටුප් වර්ධනය වීමත් සමඟ ඉහළ ගිය පරිභෝජන ප්‍රවණතා ආදිය හේතුවෙන් එකතු කළ අගය මත බදු පදනම පුළුල් වීමේ ධනාත්මක බලපෑම පිළිඹිබු කරයි. 2024 වසරේ ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා පහත හෙලීම සහ ආනයන වර්ධනය වීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 216.2 සිට 2024 වසරේ දී රු. බිලියන 250.9 දක්වා සියයට 16.0 කින් වර්ධනය විය.

දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායමෙහි සුළු අඩුවීමක් හැර නිෂ්පාදන/ සුරා බදු අය කළ හැකි සියළුම අයිතමවලින් ලැබෙන ආදායම වර්ධනය වීම හේතුවෙන් නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2023 වසරේ දී වූ සියයට 1.7 සිට 2024 වසරේ දී සියයට 2.0 දක්වා වර්ධනය විය. සියලුම වර්ගවල පෙට්‍රල් සහ ඩීසල් ආනයනයේ ශුද්ධ වැඩිවීම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය වැඩිවීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මත වූ නිෂ්පාදන බද්දෙන් ලද ආදායම වර්ධනය විය. ඇතැම් යෝජනා ක්‍රම යටතේ මෝටර් රථ ආනයනය පුළුල් කිරීම, මත්පැන් මත සුරා බද්ද සඳහා වන බදු අනුපාත ඉහළ නැංවීමේ බලපෑම හේතුවෙන් මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම ඉහළ යාම සහ උද්ධමනයට ගැලපෙන පරිදි නිෂ්පාදන බදු ගැළපීම ආදිය නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද ආදායම සඳහා බොහෝ දුරට දායක විය.

වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද , විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද , රේගු ආනයන බදු සහ සෙස් බද්ද මගින් ලද ආදායම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත බද්දෙන් ලද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී වූ සියයට 1.4 සිට 2024 වසරේ දී සියයට 1.6 දක්වා වර්ධනය විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම සාධනීය කාර්යසාධනයක් පෙන්වීය. 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව සියයට 21.3 කින් ඉක්මවා යමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 51.3 සිට 2024 වසරේ දී රු. බිලියන 115.2 දක්වා සියයට 124.4 කින් වර්ධනය විය. මෙ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සීනි සහ අර්තාපල් සඳහා තීරු බදු අනුපාත ඉහළ නැංවීම, ආනයන සීමාවන් ලිහිල් කිරීම, ඉලක්කගත ප්‍රතිපත්ති ගැලපුම් සහ ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟම ඉල්ලුම වර්ධනය වීමයි.

ප්‍රධාන වශයෙන්ම 2024 වසරේ දී රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ලද ලාභ සහ ලාභාංශවලින් වන ලැබීම් සියයට 46 කින් අඩු වීම හේතුවෙන් 2023 වසරේ දී වූ රු. බිලියන 328.3 සිට 2024 වසරේ දී රු. බිලියන 326.3 දක්වා සියයට 0.6 කින් බදු නොවන ආදායම අඩු විය.

## 2.1 | රජයේ ප්‍රධාන ආදායම් ආයතන විසින් 2024 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු පරිපාලනමය ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය ආදායම් රැස් කිරීමේ ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීම, බදු අනුකූලතාවය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ දූෂණ අවදානම් අවම කිරීම සඳහා ප්‍රධාන පරිපාලනමය ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. 2024 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාමාර්ග:

### දේශීය ආදායම් දෙපාර්තමේන්තුව:

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නිර්දේශයන්ට අනුකූලව සහ ජාත්‍යන්තර මුදල් විශුද්ධිකරණය විරෝධී සහ ත්‍රස්ත විරෝධී මූල්‍යයන ගිවිසුම් යටතේ ඇති බැඳීම් අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් බදු සම්බන්ධ වැරදි පිළිබඳව අපරාධ විමර්ශන ආරම්භ කිරීම.

- රැකියා සහ පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින් සඳහා 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සරල කළ පුද්ගල ආදායම් බදු වාර්තා පෝරමයක් හඳුන්වා දීම.

- බදු අනුකූලතා අධීක්ෂණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා විගණන තේරීම් ක්‍රමවේදය අවදානම් පාදක ප්‍රවේශයකට මාරු කිරීම හරහා අවදානම් කළමනාකරණ ඒකකය පුළුල් කිරීම.

- 2025 ඔක්තෝබර් මාසයේදී සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අහෝසි කිරීමෙන් පසු අපනයනකරුවන් සඳහා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් කඩිනම් කිරීම සඳහා ඒ වෙනුවෙන්ම දේශීය ආදායම දෙපාර්තමේන්තුවේ ඒකකයක් ස්ථාපිත කරමින් අපනයනකරු ආපසු ගෙවීම් ඒකකය ආරම්භ කිරීම.

- බලාත්මක කිරීමේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා 2025 ජනවාරි 20 දින ඒ සඳහාම වෙන්වූ අපරාධ පරීක්ෂණ ඒකකයක් පිහිටුවීම.

- මානව සම්පත් කළමනාකරණ ඒකකයේ යම් යම් කටයුතු සඳහා ආදේශ කරමින්, අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාලනය හා වගවීම පිළිබඳ පිළිගත් භාවිතයන් සමඟ අනුකූල වෙමින්, අභ්‍යන්තර කටයුතු සුපරීක්ෂණය සඳහා 2025 මාර්තු 20 දින අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම.

### ඉදිරි දැක්ම:

බදු පරිපාලනය වැඩිදුරටත් ශක්තිමත් කිරීම සහ බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් උපාය මාර්ගික මූලාරම්භයන් ගණනාවක් වැඩිදියුණු කරමින් පවතී. විගණනය හා ආපසු ගෙවීම් සම්බන්ධ එහි කාර්යභාරය ශක්තිමත් කරමින් සහ එහි මෙහෙයුම් ධාරිතාව හා විශ්ලේෂණාත්මක හැකියාවන් ඉහළ නැංවීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකය වැඩිදියුණු කෙරෙමින් පවතී. අපනයන ආපසු ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා විශේෂිත ඒකක 2ක් වශයෙන් අපනයන ආපසු ගෙවීම් තහවුරු කිරීමේ ඒකකය සහ අපනයන ආපසු ගෙවීම් සැකසුම් ඒකකය ස්ථාපිත කොට ඇත. සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අවලංගු කිරීම හේතුවෙන් මුදල් ආපසු ගෙවීමේ හිමිකම් වැඩිවීමට සූදානම් වීමක් ලෙස, නිවැරදි හා කාලෝචිත ගෙවීම සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ සැකසුම් පද්ධතියක් සංවර්ධනය වෙමින් පවතී. මීට අමතරව, 2025 ඔක්තෝබර් 1 වන දින සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය විධිමත් ලෙස අවලංගු කිරීමට පෙර, 2025 ජූලි 1 වන දින වන විට එකතු කළ අගය මත බදු වාර්තා අනිවාර්ය ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් වන ගොනු කිරීමකට මාරුවීම පහසු කිරීම සඳහා පුළුල් එකතු කළ අගය මත බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ සමඟම, 2024 සිට අලුතින් ලියාපදිංචි වූ බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව වැඩිවෙමින් පවතින බැවින්, ආදායම බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී.

### ශ්‍රී ලංකා රේගුව:

- ආයතනික දුර්වලතා මඟහරවා ගැනීමට සහ බදු පරිපාලනය, වෙළඳ පහසුකම් සැපයීම සහ බලාත්මක කිරීමෙහි තිරසාර වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා ක්‍රියාවට නැංවිය හැකි ක්‍රියාකාරී සැලැස්මක් සහ අධීක්ෂණ පද්ධතියක සහාය ඇතිව 2024–2028 උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම.

**2.1 | රජයේ ප්‍රධාන ආදායම් ආයතන විසින් 2024 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු පරිපාලනමය ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම සම්බන්ධිතයි...**

- ශ්‍රී ලංකා රේගුව තුළ සිදුවන විෂමාචාර, දූෂණ සහ සදාචාර විරෝධී ක්‍රියාවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමෙන් ආයතනික විශ්වාසනීයත්වය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශයන්ට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ අභ්‍යන්තර කටයුතු ඒකකයක් ස්ථාපිත කිරීම.

- "නිවැරදි මිනිසා නිවැරදි වෙලාවට නිවැරදි රැකියාවට" පත් කිරීමේ මූලධර්මය හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ සහ ආදායම් කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ ආයතනික ප්‍රමුඛතා සමඟ නායකත්ව භූමිකාවන් උපායමාර්ගිකව පෙළගැස්වීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මාරු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම.

- ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල විසින් සතිපතා වාර්තා කිරීම, ඵලදායි තරඟකාරිත්වයක් වර්ධනය කිරීම, එකතු නිෂ්කාශන කාර්යයන් වේගවත් කිරීම සහ සමස්ත ආදායම් රැස් කිරීම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම තුළින් ආයතනික කාර්ය සාධනය මෙහෙයවීම සඳහා "දින 80 විශිෂ්ටතා වැඩසටහන" දියත් කිරීම.

- නීතිමය නියමයන්ට අනුකූල වෙළඳුන් සඳහා වෙළඳ පහසුකම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරන අතරම, ඉහළ අවදානම් සහිත භාණ්ඩ තොග ඵලදායි ලෙස ඉලක්ක කර ගනිමින් ආදායම් සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සඳහා අවදානම් කළමනාකරණ නිර්ණායක සංශෝධනය කිරීම.

- අනුකූල නොවන ආනයන අනාවරණය කර ගැනීම සඳහා ඉහළ සාර්ථකත්ව අනුපාතයක් ඇති කිරීම සහ අමතර ආදායම වැඩි කිරීම සඳහා බහාලුම් භාණ්ඩ පරීක්ෂණ අධීක්ෂණය වැඩිදියුණු කිරීම.

- නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම සපයන අතරම ආදායම උපරිම කිරීම සඳහා ශක්තිමත් ආයතනික කැපවීමක් පිළිබිඹු කරමින් බදු පරිපාලනය සඳහා උපායමාර්ගික කාර්ය සාධනය මත පදනම් වූ සහ අවදානම්-ප්‍රතිචාරාත්මක ප්‍රවේශයක් යොදා ගැනීම.

### ඉදිරි දැක්ම:

ආදායම් පරිපාලනය තුළ කාර්ය සාධනය සහ වගවීමේ සංස්කෘතියක් ඇතුළත් කිරීම සහ ගැඹුරු ප්‍රතිසංස්කරණ කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ක්‍රියාකාරී සැලැස්ම දැඩි ලෙස අධීක්ෂණය කිරීමත් සමඟ 2024–2028 උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ. බදු අනුකූලතාව සහ වෙළඳ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවදානම මත පදනම් වූ නීති ක්‍රියාත්මක කිරීම සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම වැඩි දියුණු කරනු ලැබේ. මානව සම්පත් ධාරිතාව සහ නවීන තාක්ෂණය භාවිතය ශක්තිමත් කරනු ඇත. මෙම පියවරයන් විනිවිදභාවයෙන් යුතු, ශක්තිමත් සහ ඉහළ කාර්යසාධනයක් සහිත බදු පරිපාලනයක් ගොඩනැගීම අරමුණු කරයි. රේගු කාර්ය පටිපාටි ජාත්‍යන්තර යහ භාවිතයන් සමග පෙළගැස්වීම සහ බාධාවකින් තොර විදේශ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමට රේගු ආඥා පනත වෙනුවට නව රේගු පනතක් හඳුන්වාදීමට 2025 අයවැය මගින් යෝජනා කරන ලදී. මෙම නවීකරණයේ එක් අංශයක් ලෙස, ජාත්‍යන්තර යහ භාවිතාවන් සමඟ යමින් රේගුවේ දිගු කාමරයේ (long room) මුහුණට මුහුණ සිදු කෙරෙන ලේඛන ඇගයීම කටයුතු වෙනුවට ස්වයංක්‍රීය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා සිදු කෙරෙන ඩිජිටල් තහවුරු කිරීමේ ක්‍රමවේදයක් ආදේශ කෙරෙනු ඇත.

### සුරාබදු දෙපාර්තමේන්තුව:

- දත්ත හුවමාරු කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගැනීම, අවශ්‍යතා පිරිවිතර ලේඛනය සකස් කිරීම හා ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා විශේෂඥ උපදේශක වරයෙකු පත්කිරීම සමගින් යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කිරීම.

- බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම, නීතිමය ක්‍රියාමාර්ග සහ නීති විරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා දඬුවම් ලබා දීම තුළින් ආදායම වැඩි කිරීම සඳහා දිවයින පුරා බලපත්‍රලාභී සුරාබදු පරිශ්‍රයන්හි අධීක්ෂණය වැඩිදියුණු කිරීම.

**2.1 | රජයේ ප්‍රධාන ආදායම් ආයතන විසින් 2024 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු පරිපාලනමය ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම සම්බන්ධිතයි...**

- ගෘහස්ථ හා වාණිජ මට්ටමින් නීති විරෝධී මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ භාවිතය මැඩපැවැත්වීම සඳහා, ප්‍රමිතියෙන් තොර මත්පැන් භාවිතය අඩු කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග හරහා ආදායම වැඩි කිරීම අරමුණු කරගනිමින් දින 100 විශේෂ බලාත්මක කිරීමේ වැඩසටහනක් (2024.05.20 සිට 2024.08.27 දක්වා) ක්‍රියාත්මක කිරීම.

- ආදායම් රැස් කිරීම වැඩි කිරීමට දායක වන නීතිමය ක්‍රියාමාර්ගවලට සහාය දක්වමින් මහජන සහභාගිත්වය ශක්තිමත් කිරීම සහ පුරවැසි පැමිණිලිවලට ප්‍රමුඛතාවය දීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක 1913 හදිසි දුරකථන අංකය දියත් කිරීම.

- මධ්‍යසාර පාන වර්ග සඳහා දැඩි තත්ත්ව පාලනයන් පවත්වා ගැනීම සඳහා මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම සහ එමගින් නීත්‍යානුකූල නිෂ්පාදන වෙළඳපොළට ඇතුළුවීමට පහසුකම් සපයමින් වැඩිදියුණු කළ නියාමන ක්‍රියාත්මක කිරීම හරහා ආදායම වර්ධනය කිරීම.

- සුරාබදු ආදායම් එකතු කිරීම හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ එම අවදානම් අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම සහ එමගින් ආදායම් විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම, පාඩු අවම කිරීම සහ සමස්ත ආදායම් කළමනාකරණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

- මූල්‍ය අධීක්ෂණය වැඩි දියුණු කිරීම සහ ආදායම් ආශ්‍රිත වංචා සහ නීති විරෝධී ක්‍රියාකාරකම් අනාවරණය කර ගැනීම සහ වැළැක්වීම සඳහා සහාය වීමට මූල්‍ය බුද්ධි ඒකකයක් (FIU) ස්ථාපිත කිරීම.

- අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ දූෂ්‍ය/දුක්ගැනවිලි කාර්යක්ෂමව හැසිරවීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයක් (IAU) සහ පැමිණිලි කළමනාකරණ සහ විමර්ශන ඒකකයක් පිහිටුවීම සහ එමගින් ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලින් සුරක්ෂිත කිරීම.

- ව්‍යාජ නිෂ්පාදන සංසරණය වැළැක්වීම සහ වෙළඳපොලේ සුරාබද්දට යටත් භාණ්ඩවල සත්‍යතාව සහතික කිරීම මගින් සුරාබදු ආදායම ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක සළකුණු සහ ආරක්ෂක සළකුණු කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම.

## 2.2 බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

2023 වසරේ ජනවාරි මස 1 වන දින සිට හඳුන්වා දෙන ලද ප්‍රධාන ආදායම් බදු ප්‍රතිසංස්කරණවල සම්පූර්ණ බලපෑම 2024 වසර තුළ දී දක්නට ලැබුණි. ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවයන් සඳහා විසඳුම් සෙවීම අරමුණු කරගත් බදු ප්‍රතිපත්තියේ සැළකිය යුතු වෙනසක් මෙම ප්‍රතිසංස්කරණ මගින් සනිටුහන් විය. බදු පදනම පුළුල් කිරීම, පුද්ගලික ආදායම් බදු සීමාවන් සහ අනුපාත සංශෝධනය කිරීම සහ නීත්‍යානුකූල ලෙස බලාත්මක කිරීම සඳහා දැඩි පියවරයන් මෙම වෙනස්කම් අතරට ඇතුළත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ දී ආදායම් බදු එකතු කිරීමෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර, එය බදු අනුකූලතාවය ඉහළ නැංවීම සහ පෙර වසරේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල සමුච්චිත බලපෑම පිළිබිඹු කරයි.

2023 වසරේ දී හඳුන්වා දුන් ආදායම් බදු සම්බන්ධ ප්‍රතිසංස්කරණවලට අමතරව, 2024 වසරේ දී එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ නිෂ්පාදන/සුරාබද්ද ආදී බදු සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. එකතු කළ අගය මත බද්ද සඳහා වූ බදු නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් නිදහස් කිරීම සහ එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කරන ලදී. බදු පදනම සැලකිය යුතු ලෙස පුළුල් කරමින්, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි කිරීමේ සීමාව ද වසරකට රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා පහත හෙලන ලදී. එමෙන්ම, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා පහත හෙලන ලද අතර එමගින් මෙම සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගෙවීම සඳහා වගකිව යුතු ආයතන සංඛ්‍යාව ඉහළ ගිය අතර ආදායම් වර්ධනය සඳහා වූ හැකියාව වැඩි විය. එමෙන්ම මත්පැන් සහ දුම්වැටි සඳහා වූ නිෂ්පාදන/සුරාබදු බදු අනුපාත උද්ධමනය අනුව සකස් කරන ලදී.

**2.2 වගුව | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රඳවා තබා ගැනීමේ බද්ද**

| කාණ්ඩය | අනුපාතය (%) | අවසානාත්මක/ අවසානාත්මක නොවන |
|---|---|---|
| ලාභාංශ | 15 | අවසානාත්මක |
| පොළී හෝ ගෙවනු ලබන වට්ටම් | 5 | අවසානාත්මක නොවන |
| මසකට රු.100,000 ඉක්මවන කුලී ගෙවීම් | 10 | අවසානාත්මක නොවන |
| වෘත්තිකයන් වැනි පුද්ගලයන්ට ගෙවනු ලබන මසකට රු.100,000 ඉක්මවන සේවා ගෙවීම් | 5 | අවසානාත්මක නොවන |
| වෙනත් සියළුම අවස්ථා | 14 | අවසානාත්මක නොවන |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## විශේෂ සටහන 2.2 | ශ්‍රී ලංකාවේ ජාතික තිරු බදු ප්‍රතිපත්තිය

දකුණු ආසියානු කලාපය තුළ සිය ආර්ථිකය සමෘද්ධිමත් කරගැනීම පිණිස වෙළඳ හා මූල්‍ය ලිහිල්කරණය ද ඇතුළුව අපනයනාභිමුඛ විවෘත ආර්ථික ප්‍රතිපත්තිමය රාමුවක් සඳහා අනුගතවීමක් සිදුකළ පළමු රට වනුයේ ශ්‍රී ලංකාවයි. සිය විවෘත ආර්ථික ප්‍රතිපත්තිය තුළින් ප්‍රතිලාභ හිමිකර ගනු ලැබුව ද, වරින් වර බලයට පැමිණි රජයන්හි සමාජ සහ දේශපාලනික මතවාදයන්ට අනුකූලව ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කරගනු ලැබීම හේතුවෙන් සිය අපනයනාභිමුඛ ආර්ථික වර්ධනය තිරසර මට්ටමේ රඳවා ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූ අතර, ඒ තුළින් අවසානයේ දී මෙරට ආර්ථික ප්‍රතිපත්ති උඩු යටිකුරු වීමක් සිදුවී තිබේ.

ශ්‍රී ලංකාවේ දැනට පවතින තිරුබදු ක්‍රමය "අපනයන විරෝධී පදනමකින් යුතු තිරු බදු ක්‍රමයක්" (Anti-Export Bias Duty Regime) වශයෙන් සැලකෙන අතර, එය ව්‍යවසායයන් විසින් අපනයන සිදුකිරීම සඳහා පෙළඹවීමක් ඇති කිරීමට සමත් නොවේ. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 2000 වර්ෂයේ දී සියයට 39ක් වූ අපනයන ආදායම 2021 වර්ෂයේ දි සියයට 18 දක්වා අඩුවී ඇති අතර, මෙය මධ්‍යම ආදායමලාභී රටවල් අතර අවම මට්ටමක පවතින අපනයන කාර්යසාධනයකි. 2000 වර්ෂයේ දී, ගෝලීය සමස්ත අපනයන භාණ්ඩවල වටිනාකමින් සෑම ඇ.ඩො. 10,000ක ශ්‍රී ලංකාවේ පංගුකාරිත්වය ඇ.ඩො. 8 ක් විය. ආර්ථික ප්‍රතිපත්තින්ගේ වෙනස්වීම ඇතුළුව විවිධ සාධකවල බලපෑම හේතුවෙන් මෙම අපනයන පංගුකාරිත්වය 2021 වර්ෂයේ දී ඇ.ඩො. 5 දක්වා අඩුවී ඇති අතර, එකි කාලපරිච්ඡේදය තුළම වියට්නාමය විසින් ගෝලීය සමස්ත අපනයන භාණ්ඩවල වටිනාකම තුළ සිය පංගුකාරිත්වය ඇ.ඩො. 23 සිට ඇ.ඩො. 123 දක්වා ඉහළ නංවා ගෙන තිබේ (රූප සටහන 2).

රූප සටහන 1.

**ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවෙහි භාණ්ඩ සහ සේවා අපනයනය**




මූලාශ්‍රය: ගෝලීය සංවර්ධන දර්ශක

රූප සටහන 2.

**ගෝලීය වෙළඳපොළ හවුල්කාරිත්වය (ගෝලීය අපනයන ඇ.ඩො. 10,000 ක් තුළ පංගුකාරිත්වය)**




මෙවැනි පසුබිමක, කලාපය තුළ තරඟකාරී වෙළඳ සහ ආයෝජන ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම සඳහා පාරදෘශ්‍ය සහ දැරිය හැකි තිරු බදු ක්‍රමයක් අපේක්ෂාවෙන් ලෝක බැංකුවේ මඟ පෙන්වීම සහ විශේෂඥ දැනුම යටතේ ශ්‍රී ලංකාවේ ජාතික තිරු බදු ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී.

ජාතික තිරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඔස්සේ (i) ආනයන බදු තාර්කිකරණය කරමින් සහ ඒවායේ එකිනෙක මත යැපෙන ක්‍රියාදාමයේ ඇති එක් සිද්ධියක ඍණාත්මක බලපෑම තුළින් ඇතිවන්නා වූ නොපෙන සිද්ධි මාලාවන්හි බලපෑම (cascading effect) අවම කරමින් දැනට ක්‍රියාත්මක තිරු බදු ක්‍රමයේ අපනයන විරෝධී පදනම අවම කිරීම (ii) දැනට ක්‍රියාත්මක තිරු බදු ක්‍රමයේ සංකීර්ණතාවය සහ අවිනිශ්චිතතාවය ඉවත් කිරීම (iii) තිරු බදු ක්‍රමයේ විනිවිදබව සහ පුරෝකතනය කළ හැකි බව සහතික කිරීම (iv) බලපෑමට ලක්වීමේ විභවයක් පවතින අංශ/ කර්මාන්ත හඳුනාගැනීම සහ ඒවා ස්ථාවරවීමට හා වර්ධනය වීමට යම් කාලසීමාවක් සහාය ලබාදීම සහ ඒ අතරතුර විතැන්වූ සේවකයන් සඳහා නැවත කුසලතා නැංවීම (v) අමුද්‍රව්‍ය, අන්තර් හෝ ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීමේ දී තිරු බදු සහ බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම (vi) සම අවස්ථා ලැබීම සහතික කිරීමට සහ දේශීය ව්‍යවසායන්ගේ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සහ බදු වියදම් අඩු කිරීම සඳහා ක්‍රමිකව අදියර වශයෙන් ආනයන බදු අත්හැරීම හෝ සහන ප්‍රදානය කිරීම ඉවත් කිරීම, මගින් වෙළඳ භාණ්ඩවල මෙතෙක් අනාවරණය කරනොගත් අපනයන විභවය උපයෝගී කරගැනීම සහ සාර්ව ආර්ථික අසමතුලිතතා විසඳීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව, 2024 මැයි 31 දිනැති අංක 24/1072/604/114 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ 2024 ජූනි 11 දිනැති සිය තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය විසින් "ශ්‍රී ලංකාවේ ජාතික තිරුබදු ප්‍රතිපත්තිය" සඳහා අනුමැතිය ලබාදී ඇත.

මෙම ජාතික තිරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස, ජාතික තිරු බදු ප්‍රතිපත්ති කමිටුව සඳහා වන යොමු කිරීමේ අනුදේශ (ToR) අමාත්‍ය මණ්ඩලය වෙත 2025 මාර්තු 10 දිනැති අංක 25/0441/804/054 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා වූ අනුමැතිය 2025 මාර්තු 17 දින ලැබී ඇත. ඒ අනුව, ජාතික තිරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා 2025 මැයි 15 දින ජාතික තිරු බදු ප්‍රතිපත්ති කමිටුව ස්ථාපනය කරන ලද අතර, එම කමිටුව මේ වනවිට ක්‍රියාත්මක වේ.

2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්ද සඳහා හඳුන්වාදෙන ලද බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හේතුවෙන්, 2024 වසරේ දී රාජ්‍ය ආදායමට විශාලතම දායකත්වය සපයන තනි බද්ද ලෙස එකතු කළ අගය මත බද්ද දැකගත හැකි විය. එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 1,309.7 ක් දක්වා සියයට 88.6 කින් වර්ධනය වී ඇති අතර එය ඉතිහාසයේ පළමු වරට රු. ට්‍රිලියනය ඉක්මවා යමින් ආදායම් බද්දෙන් ලද ආදායම් එකතු කිරීම අභිබවා යන ලදී. මෙම ප්‍රතිසංස්කරණ මඟින් එකතු කළ අගය මත බද්ද සඳහා වන බදු පදනම පුළුල් වූවා පමණක් නොව එකතු කළ අගය මත බද්ද එකතු කිරීමේ කාර්යක්ෂමතාවය ද වැඩි දියුණු විය.

උද්ධමනයට අනුව දර්ශකගත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නිෂ්පාදන/සුරාබදු සඳහා ද බදු ප්‍රතිසංස්කරණ ද හඳුන්වා දෙන ලදී. සියලුම මත්පැන් වර්ග සඳහා මත්පැන් මත සුරාබද්ද සහ පෙට්‍රල් සහ ඩීසල් හැර ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අය කළ හැකි අනෙකුත් සියලුම භාණ්ඩ සඳහා නිෂ්පාදන බද්ද සියයට 14 කින් වැඩි කරන ලදී. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තහවුරු කිරීමේ පුළුල් ප්‍රයත්නයන්ට දායක වන අතරම නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම මිල වෙනස්වීම්වලට අනුව පවත්වා ගැනීම සහතික කිරීම මෙම ක්‍රියාමාර්ගයන්හි අරමුණ විය. මෙම බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, 2024 වසරේ දී රාජ්‍ය ආදායමෙහි වඩාත් සාධනීය කාර්යසාධනයක් සඳහා ඉවහල් වූ අතර තිරසාර රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අඛණ්ඩ වශයෙන් දායක වීමද සනිටුහන් කරන ලදී.

## 2.3 රජයේ ආදායම් කාර්යසාධනය

2024 වසරේ දී ප්‍රදාන ඇතුළුව රජයේ සමස්ත ආදායම 2023 දී වූ රු. බිලියන 3,074.3 සිට රු. බිලියන 4,090.8 දක්වා සියයට 33.1 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. බදු නොවන ආදායමේ ආන්තික අඩුවීමක් වුවද, බදු ආදායම 2023 දී වාර්තා වූ රු. බිලියන 2,720.6 සිට 2024 දී රු. බිලියන 3,704.6 දක්වා සියයට 36.2 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

**රූපසටහන 2.1 | රාජ්‍ය ආදායම**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 2.3 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම - 2024**

රු. මිලියන

| අයිතමය | ඇස්තමේන්තුව | තත්‍ය [*] | අපගමනය |
|---|---|---|---|
| **මුළු ආදායම** | **4,107,000** | **4,030,838** | **-76,161** |
| **බදු ආදායම** | **3,820,000** | **3,704,577** | **-115,423** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | |
| ආදායම් සහ ලාභ මත බදු | 1,080,000 | 1,025,998 | -54,002 |
| එකතු කළ අගය මත බදු - දේශීය (ශුද්ධ) | 740,000 | 712,187 | -27,813 |
| ජාතිය ගොඩනැගීමේ බදු (දේශීය) | - | 130 | 130 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (දේශීය) | 195,000 | 186,477 | -8,523 |
| වෙනත් | 9,443 | 13,043 | 3,600 |
| **මුළු උප එකතුව** | **2,024,443** | **1,937,833** | **-86,609** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | | |
| ආනයන බදු | 175,000 | 111,147 | -63,853 |
| එකතු කළ අගය මත බදු - ආනයන (ශුද්ධ) | 660,000 | 597,493 | -62,507 |
| ජාතිය ගොඩනැගීමේ බදු (ආනයන) | - | 8 | 8 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (ආනයන) | 55,000 | 64,392 | 9,392 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 175,000 | 170,014 | -4,986 |
| සෙස් බදු | 60,000 | 81,129 | 21,129 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහ අනෙකුත් | 95,200 | 115,667 | 20,467 |
| නිෂ්පාදන විශේෂ විධිවිධාන බදු | | | |
| දුම්වැටි | 143,000 | 117,145 | -25,855 |
| ඛනිජ තෙල් | 135,000 | 200,200 | 65,200 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 35,000 | 66,601 | 31,601 |
| **මුළු උප එකතුව** | **1,533,200** | **1,523,794** | **-9,406** |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | | |
| මත්පැන් /දුම්කොළ | 232,000 | 214,584 | -17,416 |
| **මුළු උප එකතුව** | **232,000** | **214,584** | **-17,416** |
| **අනෙකුත්** | | | |
| විදුලි සංදේශ බද්ද | 18,500 | 15,927 | -2,573 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 11,857 | 12,438 | 581 |
| **මුළු උප එකතුව** | **30,357** | **28,366** | **-1,991** |
| **බදු නොවන ආදායම** | **287,000** | **326,261** | **39,261** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
[*] තාවකාලික

2024 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2023 වසරේ දී වූ සියයට 9.9 සිට සියයට 12.4 දක්වා ප්‍රතිශතාංක 2.5 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, වැට බද්ද ලියාපදිංචි කිරීමේ සීමාව අඩු කිරීම සමඟින් බදු නිදහස් කිරීම්වලින් බහුතරයක් ඉවත් කිරීම සහ වැට බදු අනුපාතය වැඩිවීම පිළිබිඹු කරමින් වැට බද්දෙන් ලැබෙන ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී සියයට 2.5 සිට 2024 වසරේ දී සියයට 4.4 දක්වා සියයට 1.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ යාම මෙම ආදායම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.උද්ධමනයට අනුකූල දර්ශක ගත කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟින් බදු අනුපාත වැඩිවීම හේතුවෙන් 2024 දී නාමික වශයෙන් නිෂ්පාදන බදු/ සුරා බදු ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 469.6 සිට රු. බිලියන 598.5 දක්වා සියයට 27.4 කින් වැඩි වීම සහ බදු නිදහස් සීමාව අඩු කිරීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 2023 වසරේ දී වූ රු. බිලියන 216.2 සිට 2024 වසරේ දී රු. බිලියන 250.9 දක්වා සියයට 16.0 කින් වැඩිවීම බදු ආදායම පුළුල් වීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. ඉහත බදු ප්‍රතිපත්ති වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ දී දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 927.5 සිට රු. බිලියන 1,238.6 දක්වා සියයට 33.5 කින් වැඩි වී ඇත.

රූපසටහන 2.2 | බදු ආදායමේ සංයුතිය - 2024




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 2.4 | රාජ්‍ය ආදායම

රු. මිලියන

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **1,216,542** | **1,298,019** | **1,751,132** | **2,720,563** | **3,704,577** |
| ආදායම් බදු | 268,249 | 302,115 | 534,021 | 911,355 | 1,026,199 |
| එකතු කළ අගය මත බදු | 233,786 | 308,213 | 463,072 | 694,460 | 1,309,680 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 2,351 | 434 | 413 | 328 | 137 |
| නිෂ්පාදන බදු* | 321,970 | 306,898 | 342,563 | 469,622 | 598,529 |
| ආනයන බදු | 114,183 | 64,339 | 50,009 | 105,120 | 111,147 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 115,442 | 154,125 | 180,595 | 175,486 | 170,014 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 82,709 | 55,828 | 40,194 | 51,327 | 115,199 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | - | - | 36,111 | 216,181 | 250,869 |
| අනෙකුත් | 77,852 | 106,067 | 104,154 | 96,683 | 122,804 |
| **බදු නොවන ආදායම** | **151,417** | **159,052** | **228,052** | **328,259** | **326,261** |
| පොලී/කුලී | 19,351 | 11,556 | 13,188 | 33,231 | 64,192 |
| ලාභ සහ ලාභාංශ | 17,624 | 30,591 | 28,092 | 75,701 | 41,080 |
| දඩ, ගාස්තු හා අයකිරීම් | 47,370 | 42,645 | 90,050 | 146,566 | 154,731 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 32,417 | 34,619 | 37,416 | 36,258 | 43,089 |
| මහ බැංකු පැවරුම් | 24,009 | 15,012 | 30,007 | 1,029 | - |
| අනෙකුත් | 10,646 | 24,630 | 29,300 | 35,474 | 23,170 |
| **මුළු ආදායම** | **1,367,960** | **1,457,071** | **1,979,184** | **3,048,822** | **4,030,839** |
| **ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස** | | | | | |
| බදු ආදායම | **7.8** | **7.4** | **7.3** | **9.9** | **12.4** |
| ආදායම් බදු | 1.7 | 1.7 | 2.2 | 3.3 | 3.4 |
| එකතු කළ අගය මත බදු | 1.5 | 1.7 | 1.9 | 2.5 | 4.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු | ... | ... | ... | ... | ... |
| නිෂ්පාදන බදු* | 2.1 | 1.7 | 1.4 | 1.7 | 2.0 |
| ආනයන බදු | 0.7 | 0.4 | 0.2 | 0.4 | 0.4 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 0.7 | 0.9 | 0.8 | 0.6 | 0.6 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 0.5 | 0.3 | 0.2 | 0.2 | 0.4 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | - | - | 0.2 | 0.8 | 0.8 |
| අනෙකුත් | 0.5 | 0.6 | 0.4 | 0.4 | 0.4 |
| බදු නොවන ආදායම | **1.0** | **0.9** | **0.9** | **1.2** | **1.1** |
| පොලී/කුලී | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.2 |
| ලාභ සහ ලාභාංශ | 0.1 | 0.2 | 0.1 | 0.3 | 0.1 |
| දඩ, ගාස්තු හා අයකිරීම් | 0.3 | 0.2 | 0.4 | 0.5 | 0.5 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.1 |
| මහ බැංකු පැවරුම් | - | 0.1 | 0.1 | ... | ... |
| අනෙකුත් | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| **මුළු ආදායම** | **8.7** | **8.3** | **8.2** | **11.1** | **13.5** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික
. නොගැනිය හැක
- ලැබී නොමැත
* නිෂ්පාදන බදු තුළ දුම්කොළ බද්ද ඇතුළත් වේ.

ආනයන මත පදනම් වූ බදු වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 842.2 සිට 2024 වසරේ දී රු. බිලියන 1,398.1 දක්වා සැලකිය යුතු ලෙස සියයට 66.0 කින් වර්ධනය වී ඇති අතර එය ප්‍රධාන වශයෙන් ආනයන මත වැට් බදු ආදායම සියයට 165.1 කින් සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම සියයට 124.4 කින් වැඩිවීම හේතු වී ඇත.

පොලී ආදායම සහ දඩ, ගාස්තු සහ අය කිරීම් වලින් ලද ආදායම වර්ධනය වුවද, ලාභ සහ ලාභාංශ වලින් ලැබෙන ආදායම පහත වැටීමේ සමස්ත බලපෑම හේතුවෙන් 2023 වසරට සාපේක්ෂව 2024 දී බදු නොවන ආදායම සියයට 0.6 කින් ආන්තික වශයෙන් අඩු වී ඇත.

## ආදායම් බදු

ආදායම් බද්දෙන් ලැබෙන ආදායම 2023 වසරේ දී ලද රු. බිලියන 911.4 සිට 2024 වසරේ රු. බිලියන 1,026.2 ක් දක්වා සියයට 12.6 කින් වර්ධනය විය. ආදායම් බදු ආදායම 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 95.0 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආදායම් බද්ද 2023 වසරේදී වූ සියයට 3.3 සිට 2024 දී සියයට 3.4 දක්වා සියයට 0.1 කින් වැඩි විය. 2023 වසරේ දී රු. බිලියන 753.2 ක් වූ තනි පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු වලින් ලද ආදායම සිට 2024 වසරේ දී රු. බිලියන 862.2 දක්වා සියයට 14.5 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ උපයන විට ගෙවීම් තුළින් ලද ආදායම (PAYE) පෙර වසරට සාපේක්ෂව සියයට 36.3 කින් 2024 වසරේ රු. බිලියන 197.6 ක් දක්වා ඉහළ යාම සහ සංස්ථාපිත නොවන බදු ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 65.8 කින් 2024 වසරේ දී රු. බිලියන 80.5 ක් දක්වා ඉහළ යාමයි. 2023 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පුද්ගල ආදායම් බද්ද සඳහා වාර්ෂික බදු නිදහස් සීමාව රු. මිලියන 3.0 සිට රු. මිලියන 1.2 දක්වා අඩු කිරීමෙන් බදු පදනම පුළුල් කිරීමේ බලපෑමෙන් ආදායමේ වැඩිවීම මෙමඟින් පෙන්නුම් කෙරේ. බද්දට යටත් ආදායමෙන් සියයට 18 සිට සියයට 36.0 දක්වා අනුක්‍රමික බදු අනුපාතය පුළුල් කිරීම ද ඉහත ආදායම් වර්ධනයට ධනාත්මක ලෙස දායක විය. විශේෂයෙන් 2024 වසරේ දෙවන භාගයේදී අඩු පොලී අනුපාත තත්ත්වයක් පැවතුන ද එම වසරේ රඳවා ගැනීමේ බද්දෙන් (WHT) ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 157.9 සිට රු. බිලියන 163.8 දක්වා සියයට 3.7 කින් ඉහළ ගිය අතර එය 2024 සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 102.4 ක ළඟා කර ගැනීමකි. කෙසේ වෙතත්, දේපළ වෙළඳාම් ක්‍රියාකාරිත්වයේ නොවෙනස් තත්ත්වය හේතුවෙන් 2024 වසරේ ප්‍රාග්ධන ලාභ බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී වූ රුපියල් බිලියන 2.7 සිට රුපියල් බිලියන 1.9 දක්වා අඩු විය.

## එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලැබෙන ආදායම නාමික වශයෙන් වාර්ෂිකව වැඩිවීමක් වාර්තා කළ අතර, 2023 වසරේදී වූ රු. බිලියන 694.5 සිට 2024 වසරේ දී රු. බිලියන 1,309.7 දක්වා සියයට 88.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන මඟින් රැස්කරගන්නා ලද එකතු කළ අගය මත බද්ද සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් මෙම කැපී පෙනෙන වර්ධනය සිදු විය. දේශීය ක්‍රියාකාරකම් සඳහා වන එකතු කළ අගය මත බදු ආදායම 2023 වසරේ දී රු. බිලියන 469.1 සිට 2024 වසරේ දී රු. බිලියන 712.2 දක්වා සියයට 51.8 කින් වැඩි විය. ආනයන සඳහා වන එකතු කළ අගය මත බදු ආදායම 2023 වසරේ දී රු. බිලියන 225.4 සිට රු. බිලියන 597.5 දක්වා සියයට 165.1 කින් වැඩි විය. එකතු කළ අගය මත බදු වලින් ලැබෙන ආදායම මෙසේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළද, ආනයන සීමා කිරීම් බොහොමයක් 2024 වසරේ වැඩි කාලයක් පුරා ක්‍රියාත්මකව පැවතීම හේතුවෙන්, ආනයන සඳහා වන එකතු කළ අගය මත බදු වල ආදායම් විභවය සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගැනීමට හැකියාවක් නොලැබුණි.

බදු පරිපාලනයේ සිදුකරන ලද වැඩිදියුණු කිරීම් එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩි වීම සඳහා හේතුවිය. මූල්‍ය සේවා අංශයද ඇතුළුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 2023 වසරේ දී 14,128 සිට 2024 වසරේ දී 21,542 දක්වා සියයට 52.5 කින් වැඩි විය. 2025 පෙබරවාරි අවසානය වන විට, බදු පදනම පුළුල් කිරීමේ උත්සාහයන් වැඩිදියුණු කිරීමත් සමඟ ලියාපදිංචි එකතු කළ අගය මත බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 22,043 දක්වා තවදුරටත් වැඩිවිය. මෙම වැඩිදියුණු කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, එකතු කළ අගය මත බදු ආදායම මුළු බදු ආදායමේ කොටසක් ලෙස 2023 දී සියයට 25.5 සිට 2024 වසරේ දී සියයට 35.4 දක්වා සියයට 38.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. එය රාජ්‍ය මූල්‍ය වඩාත් ශක්තිමත් කිරීමේ උත්සාහයන්හි එකතු කළ අගය මත බදු

වගුව 2.5 | එකතු කළ අගය මත බදු ආදායම

රු. මිලියන

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| දේශීය | 275,089 | 150,823 | 185,918 | 292,293 | 469,768 | 712,326 |
| ආනයන | 169,914 | 85,727 | 122,766 | 171,478 | 225,401 | 598,048 |
| **දළ ආදායම** | **445,003** | **236,550** | **308,684** | **463,771** | **695,169** | **1,310,374** |
| ආපසු ගෙවීම | 1,126 | 2,764 | 471 | 699 | 709 | 694 |
| **ශුද්ධ ආදායම** | **443,877** | **233,786** | **308,213** | **463,072** | **694,460** | **1,309,680** |
| **ශුද්ධ ආදායම ද.දේ.නි.% ලෙස** | **2.8** | **1.5** | **1.7** | **1.9** | **2.5** | **4.4** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

වගුව 2.6 | රජයේ බදු ආදායම - ප්‍රභවයන් අනුව

රු. මිලියන

| මූලාශ්‍රය | 2023 | 2024[(a)] | 2023/2024 වෙනස (%) |
|---|---|---|---|
| ආදායම් බදු | 911,355 | 1,026,199 | 12.6 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 927,544 | 1,238,560 | 33.5 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 469,107 | 712,187 | 51.8 |
| ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | 68 | 130 | 90.3 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - දේශීය | 164,915 | 186,477 | 13.1 |
| සුරාබදු | 170,260 | 213,390 | 25.3 |
| දුම්වැටි සහ දුම්කොළ මත බදු | 118,481 | 118,339 | -0.1 |
| නිෂ්පාදන බදු - අනෙකුත් | 4,713 | 8,039 | 70.6 |
| ආනයනය මත පදනම් වූ බදු | 842,164 | 1,398,143 | 66.0 |
| ආනයන බදු | 105,120 | 111,147 | 5.7 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 225,353 | 597,493 | 165.1 |
| ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන | 260 | 8 | -97.1 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - ආනයන | 51,265 | 64,392 | 25.6 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 175,486 | 170,014 | -3.1 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 51,327 | 115,199 | 124.4 |
| සෙස් බදු | 57,184 | 81,129 | 41.9 |
| නිෂ්පාදන බදු - ඛනිජ තෙල් | 143,642 | 200,200 | 39.4 |
| නිෂ්පාදන බදු - මෝටර් රථ | 32,526 | 58,562 | 80.0 |
| බලපත්‍ර සහ අනෙකුත් | 39,500 | 41,675 | 5.5 |
| විදුලි සංදේශ බදු | 17,304 | 15,927 | -8.0 |
| අනෙකුත් | 22,195 | 25,748 | 16.0 |
| මුළු බදු ආදායම | 2,720,563 | 3,704,577 | 36.2 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(a) තාවකාලික

වල වර්ධනය වන වැදගත්කම ඉස්මතු කරමින් ද.දේ.නි යේ ප්‍රතිශතයක් ලෙස එකතු කළ අගය මත බදු ආදායම 2023 වසරේ දී සියයට 2.5 සිට 2024 වසරේ දී සියයට 4.4 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය.

## සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2024 වසරේ ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, අනිවාර්ය සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වාර්ෂික පිරිවැටුම සීමාව රු.මිලියන 120.0 සිට රු.මිලියන 60.0 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, 2024 වසරේ ජනවාරි 01 වන දින සිට, රු.මිලියන 60.0 වාර්ෂික පිරිවැටුම් සීමාව ඉක්මවන ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන්, තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන්ගේ බද්දට යටත් පිරිවැටුම මත සියයට 2.5 ක අනුපාතයකින් මෙම බද්ද අය කෙරේ. මෙම ප්‍රතිපත්ති වෙනස මගින් වැඩි ව්‍යාපාර ප්‍රමාණයක් බද්දට යටත් කිරීමෙන් බදු පදනම පුළුල් විය. 2023 වසරේ දී රු. බිලියන 216.2 වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී රු. බිලියන 250.9 දක්වා සුළු වශයෙන් වැඩි විය. ලියාපදිංචි විය යුතු වාර්ෂික පිරිවැටුම් සීමාව අඩු කිරීම හේතුවෙන් 2023 වසරේ දී 8,107 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් සංඛ්‍යාව 2024 වසරේ දී 12,097 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

## නිෂ්පාදන/ සුරා බද්ද

2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී නිෂ්පාදන / සුරාබදු මගින් ලද සමස්ත ආදායම සියයට 27.4 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර එය ප්‍රධාන බදු අය කළ හැකි කාණ්ඩ කිහිපයක් හරහා ශක්තිමත් කාර්යසාධනයක් පිළිබිඹු කරයි. 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද සුරාබදු අනුපාත සංශෝධනවල සහ 2024 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිෂ්පාදන බදු/ සුරාබදු උද්දමනයට ගැළපුමගත කරමින් දර්ශකකරන ප්‍රතිපත්තියට අනුව බදු වැඩි කිරීම හේතුවෙන් මත්පැන් සහ මෝටර් රථ වාහනවලින් ලැබුණු ඉහළ ආදායම මෙම වැඩිවීමට බොහෝ දුරට හේතු විය.

වගුව 2.7 | නිෂ්පාදන / සුරාබදු ආදායම

රු. මිලියන

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024[(a)] |
|---|---|---|---|---|---|---|
| මත්පැන් | 115,443 | 120,990 | 138,637 | 165,188 | 170,260 | 213,390 |
| දුම්වැටි/ දුම්කොළ | 87,400 | 94,383 | 88,576 | 104,200 | 118,481 | 118,339 |
| මෝටර් වාහන | 130,378 | 48,760 | 18,113 | 14,504 | 32,526 | 58,562 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 61,740 | 53,111 | 55,339 | 53,074 | 143,642 | 200,200 |
| අනෙකුත් | 4,549 | 4,727 | 6,234 | 5,598 | 4,713 | 8,039 |
| එකතුව | 399,511 | 321,970 | 306,898 | 342,563 | 469,622 | 598,529 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(a) තාවකාලික

**විශේෂ සටහන 2.3 | ශ්‍රී ලංකාව තුළ මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම**

වසර පහකට ආසන්න කාලයක් දැඩි ලෙස පැවති තාවකාලික ආනයන සීමා කිරීම්වලින් අනතුරුව, 2024 වසරේ දෙසැම්බර් මස 18 වන දින පොදු මගී ප්‍රවාහනයට යොදාගන්නා වාහන සහ විශේෂ කාර්යයන්ට යොදාගන්නා වාහන සඳහා වූ සීමාවන් ඉවත් කිරීමත් සමඟ මෝටර් රථ ආනයනය නැවත ආරම්භ විය. ඉන් අනතුරුව, 2025 ජනවාරි මස 27 වන දින සිට ව්‍යාපාර කටයුතු සඳහා යොදාගන්නා වාහන ආනයනය සඳහා වූ සීමාවන් ඉවත් කරන ලද අතර, 2025 ජනවාරි මස 31 වන දින සිට පුද්ගලික වාහන ඇතුළුව සියලුම කාණ්ඩවල වාහන සඳහා වූ සීමාවන් ඉවත් කරන ලදී.

2020 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද ආනයන සීමා කිරීම, රටේ පැවති දැඩි ගෙවුම් ශේෂ අර්බුදය කළමනාකරණය කිරීමට සහ විදේශ අංශයේ කම්පන මධ්‍යයේ විදේශ විනිමය සංචිත ආරක්‍ෂා කිරීමට හඳුන්වාදුන් කඩිනම් ක්‍රියාමාර්ගවලින් සමන්විත වූ පැකේජයක කොටසක් විය.

දළ නිල සංචිත වර්ධනය වීම, වෙළඳ හිඟය අඩුවීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සහාය ලබා දෙන විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහන යටතේ ලබා ඇති ස්ථාවර ප්‍රගතිය ඇතුළුව සාර්ව ආර්ථික ස්ථායිතාවය පිළිබිඹු කිරීමේ ලකුණු පෙන්නුම් කිරීම හේතුවෙන් වාහන ආනයනය නැවත ආරම්භ කිරීමට තීරණය කර ඇත. විදේශ අංශයට ඇති විය හැකි බලපෑම් හඳුනාගනිමින්, රජය ඒ ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා අදියර වශයෙන්, දැඩි ලෙස නියාමනය කරන ලද ප්‍රවේශයක් අනුගමනය කර තිබේ.

2025 වසරේ දී මෝටර් රථ ආනයනය මඟින් රජය විසින් ආසන්න වශයෙන් ද. දේ. නි. යෙන් සියයට 1.3 ක බදු ආදායමක් රැස්කර ගැනීමේ රාජ්‍ය මූල්‍ය අරමුණ හා අනුගත වෙමින් වාහන ආනයන තහනම ඉවත් කිරීම උපායමාර්ගිකව සිදු කරන ලද අතර, රටේ සංචිත තත්ත්වය පිළිබඳ අවදානම හඳුණාගත් ප්‍රවේශයක් ද ඊට ඇතුළත් විය.

මෙම ආදායම් අරමුණට සහාය වීම සඳහා 2025 වසරේ දී රාජ්‍ය මූල්‍ය හා නියාමන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කරන ලදී:

- 2025 ජනවාරි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, උද්ධමනයට ගැලපුම් සිදු කරමින් දර්ශකගත කිරීම මඟින් මෝටර් රථ වාහන සඳහා ඒකක අනුපාත පදනමක් මත (රුපියල් අනුව) අය කරනු ලබන නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
- මෝටර් රථ සඳහා සියයට 20 ක තීරු බද්දක් පැනවීම හා එසේ ක්‍රියාත්මක වන තීරු බද්ද සඳහා සියයට 50 ක අධිභාරයක් පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස 2025 පෙබරවාරි මස 1 වන දින සිට සියයට 30 ක මුළු තීරු බද්දක් ක්‍රියාත්මක වීම.
- 2019 වසරේ සිට හඳුන්වා දුන් මෝටර් රථ වාහන සඳහා වන සුඛෝපභෝගී බද්ද, 2025 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් වාහන හැර ඉන්ධන පරිභරණය කරන්නාවූ සෑම වාහන කාණ්ඩයක් සඳහාම රුපියල් මිලියන 1.5 කින් වැඩි කිරීම.
- පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවාහන විසඳුම් සඳහා අඛණ්ඩව සහාය දක්වන අතර විද්‍යුත් වාහන සඳහා වන සමස්ත බදු බර අභ්‍යන්තර දහන එන්ජින් සහිත වාහනවලට වඩා අඩු මට්ටමක පවත්වා ගනිමින් 2025 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් වාහන සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද දෙගුණ කිරීම.
- ආනයනය කිරීමෙන් දින 90 ක් ඇතුළත එසේ ආනයනය කරන ලද වාහන ලියාපදිංචි කිරීම අනිවාර්යය කිරීම. එසේ කිරීමට අපොහොසත් වුවහොත් සියයට 45 ක උපරිමයකට යටත්ව පිරිවැය, රක්‍ෂණ හා නැව් ගාස්තු අගයෙන් මාසිකව සියයට 3 බැගින් අය කරනු ලබන ප්‍රමාද ගාස්තුවකට යටත් වේ.
- බදු අනුකූලතාවය හා සොයා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය අනිවාර්යය කිරීම.

ආනයනික මෝටර් රථ සඳහා දැනට අදාළ වන බදු ව්‍යුහය, ආදායම් උත්පාදනය සහ පුළුල් ප්‍රතිපත්තිමය අරමුණු සමඟ අනුකූලවීමට සකසා ඇති තීරුබදු සහ බදු වර්ග කිහිපයකින් සමන්විත වේ. එම ප්‍රධාන බදු වර්ග අතරට:

- නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද
- සියයට 20 ක් වූ තීරු බද්ද
- නිශ්චිත සීමාවන් ඉක්මවා යන විට අය කරනු ලබන මෝටර් වාහන සඳහා වන සුඛෝපභෝගී බද්ද (ඉන්ධන වර්ගය අනුව වෙනස් වේ)
- සියයට 18 ක් වූ එකතු කළ අගය මත බද්ද
- තීරු බද්ද මත පනවනු ලබන සියයට 50 ක් වූ අධිභාරය
- වාහන හිමිකම් බද්ද (අදාළ කාණ්ඩ සඳහා)
- නිෂ්පාදන බද්දට යටත් නොවන වාහන සඳහා පමණක් අදාළ වන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සමාජ ආරක්‍ෂණ දායකත්ව බද්ද

2014 සිට 2023 දක්වා මෝටර් වාහන සඳහා සංයුක්ත නිෂ්පාදන බදු ක්‍රමයක් අදාළ වී තිබුණි. බදු ප්‍රතිසංස්කරණවලින් පසුව බදු ව්‍යුහය සංරචක කිහිපයකට වෙන් කරන ලදී. කෙසේ වෙතත්, මෝටර් වාහන ආනයනයේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය නිෂ්පාදන බද්ද ලෙස සැළකේ.

**විශේෂ සටහන 2.3 | ශ්‍රී ලංකාව තුළ මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම සම්බන්ධිතයි...**

**මෝටර් රථ ආනයනය සංඛ්‍යාත්මක සැසඳීම : පෙබරවාරි - මැයි 2015 - 2019 සහ පෙබරවාරි - මැයි 2025**




ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛන අංශයට අනුව, 2024 දෙසැම්බර් 18 සිට 2025 ජූනි 3 දක්වා කාලය ඇතුළත මෝටර් කාර් රථ 14,047 ක් ඇතුළුව මෝටර් රථ 49,541 ක් පමණ රේගුවෙන් නිදහස් කර ඇති අතර, එමඟින් රජයේ බදු ආදායමට රුපියල් බිලියන 149.1 ක දායකත්වයක් ලැබී ඇත. මෙමඟින් ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය ශක්තිමත් ලෙස පිළිබිඹු කරනු ලබන අතර, මෝටර් රථ ආනයනයෙන් රජය විසින් අපේක්ෂිත වාර්ෂික ආදායම් ඉලක්කය සපුරා ගැනීමට හැකි බව පිළිබිඹු කරයි.

මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම, විචක්ෂණශීලී අන්දමින් විදේශ අංශය කළමනාකරණය කරගනිමින්, ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම, ප්‍රවාහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ රජයේ ආදායම ශක්තිමත් කිරීම යන අරමුණු ප්‍රවේශමෙන් තුලනය කරමින්, ප්‍රතිපත්තිමය වෙනස මැන බැලීමට ඉවහල් වේ. මෙම ප්‍රවේශය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායිතාවය සහ තිරසාර ලෙස යථා තත්ත්වයට පත් වීමේ අඛණ්ඩ වැඩපිළිවෙල සඳහා දායක වේ.

ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා සුරාබදු මගින් ලද සමස්ත ආදායම 2023 වසරේ දී රු.143.6 සිට 2024 වසරේ දී රු.බිලියන 200.2 දක්වා සියයට 39.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම කැපී පෙනෙන වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023 වසරේ දී සිදුකළ බදු අනුපාත සංශෝධනවල සම්පූර්ණ බලපෑම සහ එම කාලය තුළ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය වැඩි වීමයි.

කෙසේ වෙතත්, සිගරට් වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී රු. බිලියන 117.5 සිට 2024 වසරේ දී රු. 117.1 දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් අඩු විය. මෙම පහත වැටීමට හේතු වූයේ විකුණුම් පරිමාවේ හැකිලීම හෝ සිගරට් ස්ථර හතරේ කාණ්ඩ අතර පරිභෝජන හැසිරීම වෙනස් වීම ය. මෝටර් රථ සඳහා නිෂ්පාදන බද්දෙන් ලැබෙන ආදායම 2023 වසරේ දී රු. බිලියන 32.5 සිට 2024 වසරේ දී රු. බිලියන 58.6 දක්වා සියයට 80.0 ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඇතැම් මෝටර් රථ කාණ්ඩ සහ නිශ්චිත අංශ සඳහා තාවකාලික ආනයන සීමාවන් ලිහිල් කිරීමයි.

**වගුව 2.8 | මත්පැන් හා දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන/සුරාබදු ආදායම**

| වර්ෂය | නිෂ්පාදනය/ අලෙවිය | | | | | | නිෂ්පාදන/සුරා බදු ආදායම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැර මත්පැන් (ලීටර මිලියන ) | % වෙනස | බීර නිෂ්පාදනය (ලීටර මිලියන ) | % වෙනස | දුම්වැටි (මිලියන) | % වෙනස | මත්පැන් (රු. බිලියන) | % වෙනස | දුම්වැටි (රු. බිලියන) | % වෙනස |
| 2014 | 43.9 | -0.6 | 124.5 | 3.6 | 3,777 | -6.4 | 69.1 | 4.6 | 57.2 | -2.3 |
| 2015 | 51.8 | 17.9 | 125.8 | 1.0 | 4,116 | 9.0 | 105.9 | 53.3 | 80.0 | 39.9 |
| 2016 | 55.6 | 7.3 | 52.2 | -58.5 | 3,789 | -7.9 | 120.8 | 14.1 | 88.8 | 11.0 |
| 2017 | 46.9 | -15.5 | 71.1 | 36.3 | 3,149 | -16.9 | 113.7 | -5.9 | 86.0 | -3.2 |
| 2018 | 25.3(අ) | -46.1 | 11.4(අ) | -84.0 | 3,150 | 0.0 | 113.9 | 0.2 | 92.2 | 7.2 |
| 2019 | 24.7 | -2.4 | 19.1 | 67.9 | 2,622 | -16.8 | 115.4 | 1.3 | 87.4 | -5.2 |
| 2020 | 22.0 | -10.9 | 11.4 | -40.4 | 2,287 | -12.8 | 121.0 | 4.9 | 94.3 | 8.0 |
| 2021 | 25.0 | 13.6 | 12.5 | 9.6 | 2,384 | 4.3 | 138.6 | 14.6 | 88.5 | -6.2 |
| 2022 | 27.0 | 8.0 | 14.1 | 12.8 | 2,825 | 18.5 | 165.2 | 19.2 | 104.2 | 17.6 |
| 2023 | 20.4 | -24.3 | 13.6 | -3.5 | 2,303 | -18.5 | 170.3 | 3.1 | 117.5 | 12.8 |
| 2024 | 19.2 | -5.8 | 14.2 | 4.9 | 1,923 | -16.5 | 213.4 | 25.3 | 117.1 | -0.3 |

මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව
(අ)2017 මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මගින් නිරූපිතය.

මේ අතර, පැණිරස පාන වර්ග, ශීතකරණ, පාම තෙල් සහ මෙද අම්ල ඇතුළු අනෙකුත් බද්දට යටත් කළ හැකි අයිතම සඳහා නිෂ්පාදන බද්දෙන් ලැබෙන ආදායම 2023 වසරේ දී රුපියල් බිලියන 4.7 ට සාපේක්ෂව 2024 වසරේ දී රුපියල් බිලියන 8.0 දක්වා සියයට 70.6 කින් තියුණු ලෙස වර්ධනය විය. මෙම වර්ධනයට බොහෝ දුරට හේතු වූයේ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා ආනයන සීමාවන් සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහ 2024 වසරේ ජනවාරි 1 වන දින සිට බද්දට යටත් කළ හැකි භාණ්ඩ සඳහා උද්ධමනය මත දර්ශකයක් හඳුන්වාදීමයි. මේ අනුව, 2024 වසරේ දී වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කයෙන් සියයට 109.8 ක් ලබා ගනිමින් රජයේ ආදායමට තුන්වන විශාලතම දායකයා ලෙස නිෂ්පාදන/ සුරාබදු බද්ද එහි ස්ථානය තහවුරු කර ගෙන ඇත.

රූපසටහන 2.3 | දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව

මිලියන 33.6 ක් දක්වා සියයට 1.2 කින් සුළු වශයෙන් අඩු විය. 2022 ජනවාරි 03 වන දින සිට බලපත්‍රලාභී නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් විසින් ආරක්ෂක සලකුණු සහ ආරක්ෂක සලකුණු කළමනාකරණ පද්ධතිය (බදු මුද්දර) මුළුමනින්ම ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, රටේ ඇතැම් ප්‍රදේශවල ව්‍යාජ ආරක්ෂක සලකුණු සොයාගත් අවස්ථා වාර්තා වී ඇත. මෙය ඇස්තමේන්තුගත ආදායම ළඟාකර ගැනීම යම්තාක් දුරකට සීමාකර ඇත. කෙසේ වෙතත්, සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ක්‍රියාත්මක කිරීම හරහා සුරාබදු දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණය ක්‍රියාවලිය ඉදිරියට යමින් පවතියි.

රූපසටහන .4 | මත්පැන් නිෂ්පාදනය සහ සුරාබදු ආදායම




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව

වගුව 2.9 | මත්පැන් මත සුරා බද්ද සංශෝධනය කිරීමේ ව්‍යුහය

| මත්පැන් වර්ගය | නිරපේක්ෂ ලීටරයක් සඳහා පෙර සීරුබදු (රු.) (2024 ජනවාරි 01 න් පසු) | නිරපේක්ෂ ලීටරයකට නව සීරුබදු (රු.) (2025 ජනවාරි 01 න් පසු) |
|---|---|---|
| විශේෂ අරක්කු | 6,840 | 7,244 |
| මොලැසස් / තල් / පොල් අරක්කු | 7,320 | 7,752 |
| රට නිෂ්පාදිත විදේශ මත්පැන් | 7,525 | 7,969 |
| බියර් (සැර - 5% ට අඩු) | 5,415 | 5,735 |
| සැර බියර් (සැර - 5% ට වැඩි හෝ සමාන) | 5,680 | 6,015 |
| වයින් | 5,415 | 5,735 |
| සකේ | 1,480 | 1,567 |
| කිරි පොන්සා | 3,760 | 3,982 |
| සයිඩර් | 4,105 | 4,347 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 170.3 සිට 2024 වසරේ දී රු. බිලියන 213.4 දක්වා සියයට 25.3 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර එය මුළු නිෂ්පාදන බදු ආදායමට සියයට 35.7 කින් දායක විය. මත්පැන් මත සුරාබදු උද්ධමනයට ගැලපුම්ගත කරමින් දර්ශකකරන ප්‍රතිපත්තියට අනුව 2024 වසරේ ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 14.0 කින් ඉහළ නංවන ලදී. 2024 වසරේ දී මත්පැන් මත සුරා බද්දෙන් ආදායම ලඟාකරගැනීම සියයට 92.8 ක් විය. කෙසේ වෙතත්, මද්‍යසාර නිෂ්පාදනය 2023 වසරේ දී නිරපේක්ෂ ලීටර් මිලියන 34.0 සිට 2024 වසරේ දී නිරපේක්ෂ ලීටර

## රේගු ආනයන බද්ද

ප්‍රධාන වශයෙන් බොහෝ ආනයනික භාණ්ඩ සඳහා වූ ආනයන සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 105.1 සිට 2024 වසරේ දී රු. බිලියන 111.1 දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. යෝජිත නිරුබදු නොවන ආනයන බදු පියවර වශයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස 2023 වසරේ මාර්තු මස 29 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බදු අනුපාත සියයට 0, 10, 15 සිට සියයට 0, 15, 20 දක්වා ඉහළ නැංවීම ද රේගු ආනයන බදු ආදායමේ වර්ධනයට දායක විය.

**විශේෂ සටහන 2.4 | වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය සම්බන්ධිතයි...**

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම (WTO-TFA) සඳහා අත්සන් තබා ඇති පාර්ශවකරුවෙකු ලෙස, එහි C කාණ්ඩය යටතේ වන බැඳීමක් ලෙස ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව එකඟ වී තිබේ. සියලු නියාමන පියවර සහ නියෝජිතායතන තනි එකිනෙකට සම්බන්ධිත වේදිකාවකට එක් කරමින් සහ දේශසීමා හරහා රටවල් අතර සිදුකරන වෙළඳ කටයුතුවල (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම) නිරත වෙළඳුන් විසින් ඉදිරිපත් කළ යුතු සියලු ලේඛන ඉදිරිපත් කිරීම සඳහා එක් ස්ථානයක් (single-entry point) සලසාලමින් සහ එකී ස්ථානය හරහාම කාලානුරූපී ආකාරයෙන් අවසන් ප්‍රතිඵල ද වෙළඳුන් වෙත ලබාදීමේ හැකියාව ඇතිකරමින් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය මගින් අන්තර්ජාතික වෙළඳ ප්‍රවාහ සඳහා පහසුකම් සලස්වයි.

ඕස්ට්‍රේලියානු රජයේ මූල්‍ය සහාය සමඟින් ශ්‍රී ලංකාවේ වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය සඳහා නිශ්චිත සැලැස්ම (Blue Print) සකස් කිරීම ලෝක බැංකුව විසින් සිදු කරන ලදී. එසේ වුව ද, මුදල් අමාත්‍යාංශය වෙත වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවේ 2022 වර්ෂයේ දී ය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය අදියර තුනකින් (3), එනම් මූලික අදියර, ක්‍රියාත්මක කිරීමේ අදියර සහ මෙහෙයුම් අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා 2022 ජූනි 20 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි, ප්‍රතිපත්තිමය මට්ටමේ තීරණ ගැනීම පිණිස භාණ්ඩාගාර ලේකම්ගේ සභාපතිත්වය යටතේ ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටුවක් සහ තාක්ෂණික මට්ටමේ තීරණ ගැනීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ සභාපතිත්වය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් ස්ථාපිත කිරීම සිදුවිය. එකී කාර්යය සඳහාම වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීම ඔස්සේ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒකාබද්ධ අරමුදලින් මූල්‍යයනය කිරීම සහ ව්‍යාපෘතිය මාස 36 කින් නිම කිරීමේ කාලගත ඉලක්කය සමඟින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ සමස්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය වගකීම දරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් 2024 ඔක්තෝබර් මාසයේ සිට ව්‍යාපෘතියේ මූලික අදියර ආරම්භ කරන ලද අතර, දැනට එහි ක්‍රියාත්මක කිරීමේ අදියරට ළඟා වී ඇත.

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කරගැනීමේ අරමුණින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා විදේශ අරමුදල් සපයන විභව්‍ය නියෝජිතායතන සමඟ සාකච්ඡා සිදුකරන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් ඇතැම් ඉතා වැදගත් කාර්යය පැකේජ සඳහා තාක්ෂණික සහාය ලබාදීමට ඇතැම් විදේශ අරමුදල් සපයන නියෝජිතායතන එකඟ වී ඇත.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහාය ලබාදීම සඳහා එකඟ වූ පරිදි, ඔවුන් විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ අවශ්‍ය කරන තාක්ෂණික සහාය පිළිබඳ අදාළ විෂය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි වූ අධ්‍යයනයක් (scoping study) සහ ශ්‍රී ලංකාවේ සංදර්භය සඳහා යෝග්‍ය තනි කවුළු පද්ධති ආකෘතියක් පිළිබඳ නිර්දේශ යෝජනා කිරීම සඳහා අධ්‍යයනයක් ද තවදුරටත් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයන දෙකෙහිම වාර්තා නුදුරේදීම මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලැබීමට නියමිත ය.

ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණික සහාය යටතේ ලබාදීමට නියමිත නිර්දේශ මත පදනම්ව, ශ්‍රී ලංකාවේ සංදර්භය සඳහා යෝග්‍ය තනි කවුළු පද්ධතියක් මිලදී ගැනීම සහ වැඩිදියුණු කිරීම/ සකස් කිරීම සිදුකරනු ඇති අතර, පළමු අදියර සඳහා තෝරාගෙන ඇති නියෝජිතායතන 18 අතුරින් දේශසීමා ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමන නියෝජිත ආයතනවලින් තෝරාගත් හයක් නියෝජිතායතන (06) නියමු පරීක්ෂණයක් ලෙසට තනි කවුළු මධ්‍ය පද්ධතියට (Single Window Core System) ඒකාබද්ධ කෙරේ. ඉතිරි නියෝජිතායතන 2027 වර්ෂය වනවිට මෙම මධ්‍ය පද්ධතියට ඒකාබද්ධ කිරීමට නියමිත අතර, 2027 වර්ෂය අවසානය වනවිට දේශසීමා ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමන නියෝජිතායතන 18 එකිනෙකට සම්බන්ධ කිරීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට අපේක්ෂිතය.

මීට සමගාමීව, වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය සඳහා අවශ්‍ය නීත්‍යානුකූලභාවය ලබාදීම සඳහා වන සියලු අවශ්‍ය කරුණු ඇතුළත් එක් පරිපූර්ණ නීතියක් ද ඇතුළුව අවශ්‍ය සියලු නෛතික යටිතල පහසුකම් නියමිත පරිදි සැකසෙනු ඇත.

**විශේෂ සටහන 2.5 | නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම**

**නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම**

ශ්‍රී ලංකා රජය විසින් ආසියානු කලාපය තුළ රටවල් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්/ වරණීය වෙළඳ ගිවිසුම් පහක් (05) පහත සඳහන් කර ඇති පරිදි අත්සන් කර ඇත:

- දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) – ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව මෙම ගිවිසුමට අයත්වන අතර 2006 ජනවාරි 01 වැනි දින සිට බලාත්මක විය.
- ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) – 2000 මාර්තු 01 වැනි දින සිට බලාත්මක විය.
- සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSLFTA) – 2018 මැයි 01 වැනි දින සිට බලාත්මක විය.
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) – 2005 ජූනි 12 වැනි දින සිට බලාත්මක විය.
- ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) – 2024 පෙබරවාරි 03 වැනි දින අත්සන් කරන ලද නමුදු, තවමත් ක්‍රියාත්මක කර නොමැත.

තවත් යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම්/ වරණීය වෙළඳ ගිවිසුම පහක් (05) සම්බන්ධයෙන් එකඟතාවයන්ට පැමිණීමෙ සාකච්ඡා සිදුකරමින් පවතී. එනම්;

- **ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)**

යෝජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමට අදාළ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් එකඟතාවයන්ට එළැඹීමෙ සාකච්ඡා දැනට සිදුකරමින් පවතින අතර, 2016 වර්ෂයේ සිට මේ දක්වා දැනට සාකච්ඡා වට 14 ක් පවත්වා ඇත.

යෝජිත ගිවිසුමේ විෂය පථය තුළට පහත සඳහන් පරිච්ඡේද ඇතුළත් වනු ඇත.

i. භාණ්ඩ වෙළඳාම
ii. සේවා වෙළඳාම
iii. ප්‍රභවස්ථාන පිළිබඳ නීති
iv. සනීපාරක්ෂාව සහ ශාක සනීපාරක්ෂාව පිළිබඳ පියවර
v. වෙළඳාම සඳහා තාක්ෂණික බාධා
vi. ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාවය
vii. ආරවුල් නිරවුල් කිරීම සහ නීති කටයුතු

යෝජිත ගිවිසුමෙහි විෂය පථය තුළට ආයෝජන සම්බන්ධිත පරිච්ඡේදයක් ඇතුළත් කිරීමට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව විසින් මූලිකව එකඟ වුව ද, ආයෝජන සම්බන්ධ කටයුතු කඩිනම් කිරීම සඳහා එය ETCA විෂය පථයෙන් බැහැරව කඩිනමින් සාකච්ඡා කිරීම සඳහා තීරණය විය.

- **ශ්‍රී ලංකා - චීන නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)**

මෙය ශ්‍රී ලංකාව සහ චීනය අතර යෝජිත ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුමක් වන අතර, මේ සම්බන්ධයෙන් වූ සාකච්ඡා වට 06 ක් දැනටමත් පවත්වා ඇති අතර, රටවල් දෙකෙහිම එකඟතාවයෙන් 07 වැනි සාකච්ඡා වාරය පැවැත්වීමට තීරණය කරනු ඇත.

මෙම ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම්වලට අදාළ එකඟතාවයන්ට එළැඹීමෙ සාකච්ඡාවල දී, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ වෙළඳාම (තීරු බදු ලිහිල්කරණ වැඩසටහන) සම්බන්ධිත පරිච්ඡේදයේ කාර්යයන්ට සම්බන්ධ වේ.

- **ඉන්දුනීසියා - ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම**

2023 ජූලි 10 දිනැති අංක 23/1248/601/042 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත වරණීය වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම සඳහා වන පාර්ශකරුවන්ගේ ඒකාබද්ධ ප්‍රකාශයට අනුව, මෙහි පළමු රැස්වීම 2024 අප්‍රේල් 03 සහ 04 යන දිනවල දී මාර්ගගත ආකාරයෙන් පවත්වන ලදී.

දෙවන වෙළඳ සාකච්ඡා වටය (TNC) 2024 ජූලි මස 15 සිට 16 දක්වා කොළඹ දී පැවති අතර, මෙම සාකච්ඡා වාරයේ දී මෙම ගිවිසුමට අදාළව අනුගමනය කළ යුතු යෝජිත පිළිවෙළ (modality) සම්බන්ධයෙන් දෙපාර්ශවයම එකඟතාවයට පැමිණෙන ලදී. එකඟතාවයට පැමිණෙන භාණ්ඩ ලැයිස්තුවක් මත පනවා තිබෙන බදු ඉවත් කිරීම හෝ අඩු කිරීම සම්බන්ධයෙන් පමණක් සීමාවී කටයුතු කිරීමට මෙම යෝජිත වරණීය වෙළඳ ගිවිසුමෙහිදී අවධානය යොමු කෙරේ.

**විශේෂ සටහන 2.5 | නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සම්බන්ධිතයි...**

- බංගලාදේශ - ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම

එවකට සිටි වෙළඳ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ අංක 21/1011/313/034 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ජූනි 14 දිනැතිව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් යෝජිත බංග්ලාදේශ -ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුමට අදාළ සාකච්ඡා ආරම්භ කිරීමට අනුමැතිය ලැබී ඇති අතර, මේ දක්වා සාකච්ඡා වට 03ක් පවත්වා ඇත. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 100කට අදාළ භාණ්ඩ ලැයිස්තුවක් හුවමාරු කරගෙන ඇති නමුදු මේ දක්වා ඒ සම්බන්ධිත කටයුතු අවසන් කර නොමැත.

2024 මැයි 9 සහ 10 දිනැතිව 4 වැනි සාකච්ඡා වටය පැවැත්වීමට නියම කරගෙන තිබුණ ද, එවකට බංග්ලාදේශයේ පැවති වාතාවරණය හේතුවෙන් එම සාකච්ඡා වටය නොපැවැත්වූ අතර, එම 4 වැනි සාකච්ඡා වටය ආරම්භ කිරීම පිළිබඳව රටවල් දෙකම තවමත් එකඟතාවයකට පැමිණ නොමැත.

- මැලේසියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

යෝජිත ශ්‍රී ලංකා - මැලේසියා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා අතිගරු ජනාධිපති විසින් ඉදිරිපත් කළ 2024 මැයි 31 දිනැති අංක 24/1074/601/069 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූනි 11 දිනැති තීරණය මගින් අනුමැතිය ලබාදී ඇත. එසේ වුව ද, එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා රටවල් දෙකම තවමත් එකඟතාවයකට පැමිණ නොමැත.

භාණ්ඩ වෙළඳාම සම්බන්ධිත එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා මුදල් අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවයෙන් සිදුකරන ලද අතර, එකඟතාවයට එළැඹීමේ සාකච්ඡාවලදී යෝග්‍ය පරිද්දෙන් අදාළ නියෝජනයන් ලබාගැනීම සඳහා වෙළඳ ප්‍රජාවන්, වාණිජ මණ්ඩල සහ කර්මාන්තකරුවන් ආදී පාර්ශව සමඟ බාහිර උපදේශන ප්‍රමාණවත් පරිදි පවත්වන ලදී.

සීනි හෝ වෙනත් පැණි රසකාරක ද්‍රව්‍ය එකතු නොකළ කිරි සහ ක්‍රීම, තිරිඟු, ලිහිසි තෙල්, තිරිඟු ධාන්‍ය සහ ඔක්ටේන් අංක 95 සහිත පෙට්‍රල් වලින් ඉහළම රේගු ආනයන බදු ආදායම් ලැබුණි. රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2024 වසරේ වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 175.0 න් සියයට 63.5 කි.

## විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

සීනි සහ අර්තාපල් සඳහා වන තීරු බදු අනුපාත ඉහළ නැංවීම සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන පරිමාව වැඩි වීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 51.3 සිට 2024 වසරේ දී රු. බිලියන 115.2 දක්වා සැලකිය යුතු ලෙස සියයට 124.4 කින් වැඩි විය. සහල්, සීනි සහ පොල්තෙල් මගින් ඉහළම විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම් ලැබුණි. මෙය රු. බිලියන 95.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 121.3 ක ළඟාකර ගැනීමකි.

## වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද

වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 175.5 සිට 2024 වසරේ දී රු. බිලියන 170.0 දක්වා සියයට 3.1 කින් සුළු වශයෙන් අඩු විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2024 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යවශ්‍ය අයිතම 26 ක් සඳහා වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු ඉවත් කිරීමේ සහ ලෝක බැංකුවේ සහාය ඇතිව ක්‍රියාත්මක වන සංවර්ධන ප්‍රතිපත්ති ණය වැඩසටහනේ කොටසක් ලෙස 2023 වසරේ අප්‍රේල් 3 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංයෝජිත සංකේතාංක අයිතම 1,631 ක් සඳහා වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු ඉවත් කිරීමේ සම්පූර්ණ බලපෑමයි. 2023 වසරේ සිට සමාන වාරික වශයෙන් වසර පහක කාලයක් තුළ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. 2023 වසර අවසාන වන විට, පෙර වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දට යටත් වූ මුළු අයිතමවලින් සියයට 50 ක් පමණ නියෝජනය කරන සංයෝජිත සංකේතාංක අයිතම 4,100 ක් පමණ නිදහස් කර ඇති අතර එමගින්, බදු අය කළ හැකි ආනයන පදනම සැලකිය යුතු ලෙස අඩු කර ඇත. 2024 වසරේ දී, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද යටතේ ආදායම උත්පාදනය කරන ලද ප්‍රධාන අයිතම වූයේ මෝටර් රථ, විශේෂයෙන් දෙමුහුන් සහ විදුලි වාහන, යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික උපකරණ, විදුලි උපකරණ, ප්ලාස්ටික් හා ප්ලාස්ටික් භාණ්ඩ සහ යකඩ හා වානේ නිෂ්පාදන වේ.

## වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)

ආනයන සහ අපනයන මත සෙස් බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 57.2 සිට 2024 වසරේ දී රු. බිලියන 81.1 දක්වා සියයට 41.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම අරමුණු කරගත් සීමාකාරී ප්‍රතිපත්ති ඉවත් කිරීම සහ 2023 වසරේ සිට වසර තුනක කාලයක් තුළ සෙස් (තීරුබදු නොවන ආනයන බදු) ක්‍රමයෙන් ඉවත් කිරීමට රජය ගත් තීරණය මෙම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආනයන මත සෙස් බද්දෙන් රැස් කරන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 55.0 සිට 2024 වසරේ දී රු. බිලියන 79.1 දක්වා සියයට 44.0 කින් වැඩි විය. මේ අතර, අපනයන මත සෙස්

**වගුව 2.10 | ජාත්‍යන්තර වෙළඳ කටයුතු මගින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාර : 2022-2024**

රු. මිලියන

| විස්තරය | 2022 | 2023 | 2024(අ) | විස්තරය | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|
| අපනයන සෙස් බද්ද | **2,243** | **2,229** | **1,996** | වාණිජ භෝග සංවර්ධනය | **64,074** | **56,008** | **41,517** |
| තේ - තේ (බදු සහ අපනයන පාලන) පනත,තේ මණ්ඩල නීති යටතේ | 465 | 523 | 415 | තේ | 462 | 686 | 499 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 10 | 7 | 11 | රබර් | 652 | 655 | 514 |
| පොල් - පොල් සංවර්ධන පනත යටතේ | 189 | 186 | 213 | පොල් | 213 | 450 | 500 |
| අ.සං.ම. සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ | 1,579 | 1,513 | 1,357 | කජු | 29 | 47 | 55 |
| **ආනයන මත සෙස් බද්ද** | **68,076** | **54,955** | **79,133** | සුළු අපනයන භෝග (කුරුඳු, කොකෝවා, කෝපි, ගම්මිරිස්) | 241 | 388 | 370 |
| අපනයන සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ | 68,076 | 54,955 | 79,133 | සමස්ත කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා පොහොර සහනාධාරය | 62,477 | 53,782 | 39,579 |
| **එකතුව** | **70,318** | **57,184** | **81,129** | **එකතුව** | **64,074** | **56,008** | **41,517** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

බද්ද 2023 වසරේ දී රු. බිලියන 2.2 සිට 2024 වසරේ දී රු. බිලියන 2 දක්වා සුළු වශයෙන් අඩු විය. අපනයන සෙස් ආදායමට දායක වූ ප්‍රධාන නිෂ්පාදන වූයේ තේ සහ පොල් ය. කෙසේ වෙතත්, රජය 2025 වසරේ දී සෙස් බද්ද මගින් රු. බිලියන 100 ක ආදායමක් බලාපොරොත්තු වේ.

## වෙනත් බදු

### විදුලි සංදේශ බද්ද

විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 17.3 සිට 2024 වසරේ දී රු. බිලියන 15.9 දක්වා සියයට 8.0 කින් අඩු විය. ආර්ථික පීඩනයන්, පරිශීලකයින් වඩාත් දැරිය හැකි පැකේජ වෙත මාරු වීම සහ සීමිත භාවිතය නිසා සාම්ප්‍රදායික විදුලි සංදේශ සේවා සඳහා පාරිභෝගික වියදම් අඩුවීම මේ සඳහා හේතු විය. එමෙන්ම, සාම්ප්‍රදායික හඬ සහ කෙටි පණිවුඩ සේවාවලින් අන්තර්ජාලය පදනම් කරගත් සන්නිවේදන මාර්ග වෙත අඛණ්ඩව සංක්‍රමණය වීම ද විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම පහත වැටීමට දායක විය. ස්ථාවර ප්‍රවේශ සේවා සම්බන්ධතා 2023 වසරේ දී 2,308,000 සිට 2024 වසරේ දී 2,122,000 දක්වා අඩු වූ අතර, එය සාම්ප්‍රදායික ස්ථාවර දුරකථන සේවා මත යැපීම අඛණ්ඩව අඩුවීමක් පෙන්නුම් කරයි. 2023 වසරේ දී 28,986,000 ක් වූ ජංගම දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 දී 28,820,000 දක්වා පහත වැටුණි. දත්ත මත පදනම් වූ සේවාවන් වෙත සිදුවන සංක්‍රමණය කැපී පෙනෙන ලෙස පෙන්නුම් කරමින්, 2023 වසරේදී 22,864,000 ක් වූ ජංගම අන්තර්ජාල සේවා ඇතුළුව අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 වසරේදී 23,149,000 දක්වා වර්ධනය විය.

### අපගමන බද්ද

අපගමන බද්දෙන් එකතු වූ ආදායම 2023 වසරේ දී රු. බිලියන 38.8 සිට 2024 වසරේ දී රු. බිලියන 38.3 දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් අඩු විය. අපගමන බද්දෙන් ලැබෙන ආදායම වැඩි කර ගැනීම සඳහා, අපගමන බද්ද එකතු කරනු ලබන අධිකාරියේ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ශක්තිමත් කිරීමට රජය පියවර ගනිමින් සිටී. තවද, ගුවන්තොටුපළ වෙත වැඩි මගින් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය විසින්, අපගමන බද්දෙන් සියයට 50 ක සහනයක්, එනම් පුද්ගලයෙකු සඳහා අදාළ වන ඇමරිකානු ඩොලර් 60 ක බද්දෙන් ඇමරිකානු ඩොලර් 30 ක සහනයක් කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ-රත්මලාන භාවිතා කරන මගින් සඳහා 2025 මාර්තු 27 සිට තවත් වසරක කාලයක් සඳහා ලබා දීමටත්, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ භාවිතා කරන මගින් සඳහා 2025 පෙබරවාරි 01 සිට වසරක කාලයක් සඳහා ලබා දීමටත්, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි නියමිත ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කරන ගුවන් සමාගම් සඳහා 2025 දෙසැම්බර් 28 දක්වා අපගමන බද්දෙන් සම්පූර්ණ සහනයක් ලබා දීමටත් රජය තීරණය කරන ලදී.

### ඔට්ටු ඇල්ලීම හා සූදු බද්ද

සංචාරකයින්ගේ පැමිණීම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ විනෝදාස්වාද ක්‍රියාකාරකම් පුළුල් වීම සහ එවැනි ක්‍රීඩා ව්‍යාපාර ස්ථානයකට ඇතුළු වන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා 2023 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රවේශ ගාස්තුවක් පැනවීම පිළිබිඹු කරමින්, 2024 වසරේ ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්දෙන් රැස් කරන ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 7.4 සිට රු. බිලියන 9.8 දක්වා කැපී පෙනෙන ලෙස සියයට 32.2 කින් වර්ධනය විය.

සූදු හෝ බුකිකරුවෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින්ගෙන් වාර්ෂික බද්දෙන් උපයන ලද බදු ආදායම 2023 වසරේ වූ රු. බිලියන 1.4 සිට 2024 වසරේ දී රු. බිලියන 3.2 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, මෙම කර්මාන්තයට නව ප්‍රවේශ වීම මෙම වර්ධනයට හේතු වී ඇත. තවද, සූදු හෝ බුකිකරුවෙකු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින්ගෙන් දළ එකතුව මත බදු ආදායම 2023 වසරේ දී රු. බිලියන 3.7 සිට 2024 වසරේ දී රු. බිලියන 4.3 දක්වා සියයට 16.1 කින් වැඩි වී ඇති අතර,

2023 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම බදු අනුපාතය සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීම මේ සඳහා හේතු වී ඇත.

## බදු නොවන ආදායම

බදු නොවන ආදායම නාමික වශයෙන්, 2023 වසරේ දී රු. බිලියන 328.3 සිට 2024 දී රු. බිලියන 326.3 දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් අඩු විය . ලාභ සහ ලාභාංශ සහ අනෙකුත් බදු නොවන ආදායම් වලින් ලැබෙන ආදායම් එකතු කිරීමේ අඩුවීම මෙයින් පිළිබිඹු වේ. කෙසේ වෙතත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2023 වසරේ දී සියයට 1.2 සිට 2024 වසරේ දී සියයට 1.1 දක්වා සියයට 0.1 කින් අඩු විය. මේ අතර, පොලි අනුපාත අඩු වුව ද, පොලී ආදායමෙන් ලැබෙන බදු නොවන ආදායම 2023 වසරේ දී රු. බිලියන 26.2 සිට 2024 වසරේ දී රු. බිලියන 57.8 දක්වා සියයට 120.1 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. දඩ, ගාස්තු සහ අයකිරීම් වලින් ලැබෙන ආදායම ද 2023 දී රු. බිලියන 146.6 සිට 2024 වසරේ දී රු. බිලියන 154.7 දක්වා සියයට 5.6 කින් වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලැබෙන ආදායම 2023 දී රු. බිලියන 36.3 ක් වූ අතර 2024 වසරේ දී එය රු. බිලියන 43.1 ක් දක්වා සියයට 18.8 කින් සුළු වශයෙන් වැඩි විය. මේ අතර, අනෙකුත් බදු නොවන ආදායම් මාර්ග වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී රු. බිලියන 35.5 ක් වූ අතර එය 2024 වසරේ දී රු. බිලියන 23.2 ක් දක්වා සියයට 34.7 කින් අඩු විය.

වගුව 2.11 | බදු නොවන ආදායම

රු. මිලියන

| අයිතමය | 2023 | 2024[අ] | 2023/2024 (ප්‍රතිශතක වෙනස) | 2024 (සමස්ථ බදු නොවන ආදායමේ % ලෙස) |
|---|---|---|---|---|
| පොලී/කුලී | 33,231 | 64,192 | 93.2 | 19.7 |
| ලාභ සහ ලාභාංශ | 75,701 | 41,080 | -45.7 | 12.6 |
| විකුණුම් සහ ගාස්තු | 146,566 | 154,731 | 5.6 | 47.4 |
| සමාජ ආරක්ෂණ දායක මුදල් | 36,258 | 43,089 | 18.8 | 13.2 |
| මහ බැංකු ලාභ පැවරීම | 1,029 | - | - | - |
| අනෙකුත් | 35,474 | 23,170 | -34.7 | 7.1 |
| **එකතුව** | **328,259** | **326,261** | **-0.6** | **100.0** |

මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

[අ] තාවකාලික

වගුව 2.12 | රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය

රු. බිලියන

| අයිතමය | 2023 | 2024 ඇස්තමේන්තුව | 2024[අ] | විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 911.4 | 1,080.0 | 1,026.2 | 2023 වසර හා සැසඳීමේ දී 2024 වසරේ ආදායම් බදු මගින් ලද ආදායම සියයට 12.6 කින් ඉහළ ගොස් ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 95.0 ක ලඟා කරගැනීමක් වේ. 2024 වසරේ ආදායම් බදු මගින් ලද තතා ආදායම, 2024 වසර සඳහා වූ ඇස්තමේන්තුවෙන් ආසන්න වශයෙන් සියයට 5 ක් හෝ රු. බිලියන 53.8 කින් විචලනය වී ඇත.<br>මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>- වසරකට රු. මිලියන 3.0 ක්ව පැවති පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව රු. මිලියන 1.2 දක්වා පහත දැමීම තුළින් පුළුල් වූ බදු පදනමෙහි සමස්ත බලපෑම.<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළයාම.<br>- ආර්ථික ක්‍රියාකාරකම් වල ඇති වූ පුනර්ජීවනය සහ ;<br>- බදු පරිපාලනය ශක්තිමත් කිරීම. |
| එකතුකළ අගය මත බදු | 694.5 | 1,400.0 | 1,309.7 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 93.5 ක් ලඟාකරගනිමින් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු මගින් ලද ආදායම රු. බිලියන 1,309.7 දක්වා සියයට 88.6 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. එකතු කල අගය මත බදු ආදායම සැලකියයුතු ලෙස වැඩිවීම සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත.<br>- 2024 ජනවාරි පළමුවන දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ දැමීම.<br>- 2024 වසරේ ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත වූ බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 දක්වා පහත දැමීම.<br>- 2024 වසරේ ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන අයිතමයන් සඳහා පැවති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් අහෝසි කිරීම;<br>- 2023 වසරේ දී එ.ජ.ඩො බිලියන 16.8 ක් වූ සමස්ත ආනයන 2024 වසරේ දී එ ජ ඩො බිලියන 18 8 දක්වා සියයට 12.1 කින් ඉහළ යාම සහ ;<br>- ආර්ථික ක්‍රියාකාරකම් වල ඇති වූ පුනර්ජීවනය |

රු. බිලියන

| අයිතමය | 2023 | 2024 ඇස්තමේන්තුව | 2024(අ) | විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| නිෂ්පාදන / සුරා බද්ද | 469.6 | 545.0 | 598.5 | වාර්ෂික ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 53.5 ක් අභිබවමින් 2024 වසරේ නිෂ්පාදන බදු මගින් ලද ආදායම රු. බිලියන 598.5 දක්වා සියයට 27.4 කින් ඉහළ ගොස් ඇත. මෙම ඉහළ කාර්යසාධනය සඳහා පහත සඳහන් හේතු මූලික වශයෙන් බලපා ඇත.<br>- ඒකක අනුපාත සහිත නිෂ්පාදන බද්දට යටත් සියලුම භාණ්ඩ සඳහා වන නිෂ්පාදන බද්ද වැඩිකිරීම සහ උද්ධමනයට ගැලපු දර්ශක ගත කිරීමක් මත පදනම්ව සියලුම මත්පැන් වර්ග සඳහා සුරාබදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීම.<br>- සියලු වර්ග වල පෙට්‍රල් සහ ඩීසල් ආනයනයන් හි ශුද්ධ වශයෙන් වැඩිවීම මත මෙණිජතෙල් මත වූ නිෂ්පාදන බදු අනුපාත ඉහළ දැමීම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වැඩි වීම.<br>- සමහර වාහන කාණ්ඩයන් සඳහා තාවකාලිකව පනවා තිබූ ආනයන සීමා ලිහිල් කිරීම සහ විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන ආනයනය කිරීම සඳහා අවසර දීම හේතුවෙන් මෝටර් රථවාහන සඳහා වූ නිෂ්පාදන බදු ආදායම ඉහළ යාම.<br>- 2023 ජුලි මස සිට ක්‍රියාත්මක වන පරිදි සුරාබදු අනුපාත සංශෝධනය කිරීමේ සමස්ත බලපෑම සමගින් සුරාබදු මගින් ලද ආදායම ඉහළ යාම.<br>කෙසේවුවද, සිගරට් අලෙවිය අඩුවීම හෝ සිගරට් වර්ගයන් අතරේ පරිභෝජන හැසිරීම විතැන්වීම හේතුවෙන් සිගරට් මත වූ නිෂ්පාදන බදු ආදායම ආන්තික ලෙස පහළ ගොස් ඇත. |
| ආනයන බදු | 105.1 | 175.0 | 111.1 | 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ආනයන බදු මගින් ලද ආදායම රු. බිලියන 111.1 දක්වා සියයට 5.7 කින් ආන්තිකව වර්ධනය වී ඇති අතර, 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 63.5 ක් ලඟාකරගෙන ඇත. මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>- 2023 මාර්තු මස 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10, සියයට 15 සිට සියයට 0, සියයට 15 හා සියයට 20 දක්වා සංශෝධනය කිරීමෙහි සමස්ත බලපෑම ලඟාකරගැනීම.<br>- කිරිගු පිටි සහ කිරිපිටි සඳහා පැවති බදු සහන ඉවත් කිරීම සහ සහල් ආනයන ඉහළ යාම.<br>- 2024 වර්ෂයේ සමස්ත ආනයන සියයට 12.1 කින් ඉහළ යාම. |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද | 175.5 | 175.0 | 170.0 | 2024 වසරේ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු මගින් ලද ආදායම රු. බිලියන 170.0 දක්වා සියයට 3.1 කින් පහළ ගොස් ඇත. මෙම අඩු වීම සඳහා මූලික වශයෙන් පහත හේතු බලපා ඇත.<br>- වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු ක්‍රමිකව ඉවත් කිරීමේ එක් අදියරක් ලෙස 2023 වසරේ අප්‍රේල් මස හතර වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දට යටත්වන අයිතම වලින් සියයට 20 ක් නිදහස් කිරීම;<br>- 2024 මාර්තු 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිංගප්පූරු- ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව සිංගප්පූරුවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ වර්ග 595 ක් වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් ඉවත් කිරීම හා නවත් භාණ්ඩ වර්ග 3,117 ක් සඳහා සහනදායි අනුපාත හඳුන්වා දීම<br>2024 වසරේ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු පදනම පහත දැමීම හමුවේ වුවද, සඵලදායි බදු එකතු කිරීමේ යාන්ත්‍රණය හා ශක්තිමත් අනුකූලතාවය පැවතීම හේතුවෙන් 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 97.2 ක් ලඟාකරගැනීමට හැකි වී ඇත. |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 51.3 | 95.0 | 115.2 | 2024 වසරේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම සියයට 124.4 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. ඒ සඳහා ;<br>- අර්තාපල් සහ සීනි සඳහා වූ බදු අනුපාත ඉහළ දැමීම සහ ප්‍රධාන පරිභෝජන භාණ්ඩයන් හී වැඩි වූ ආනයන හේතු වී ඇත.<br>විශේෂ වෙළඳ භාණ්ඩ බදු මගින් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 121.3 ක් දක්වා ලඟාකරගෙන ඇත. |

රු. බිලියන

| අයිතමය | 2023 | 2024 ඇස්තමේන්තුව | 2024[(a)] | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 216.7 | 250.0 | 250.9 | 2024 වසරේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලද ආදායම රු. බිලියන 250.9 දක්වා සියයට 16.0 කින් ඉහළ ගොස් ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත.<br>- 2023 වසරේ දී 8,107 ක් වූ ලියාපදිංචි වූ බදු ගෙවන්නන් ප්‍රමාණය 2024 වර්ෂයේදී 12,097 ක් දක්වා සැලකියයුතු ලෙස ඉහළයාමත් සමගින් බදු අනුකූලතාවය ශක්තිමත් වීම,<br>- ලියාපදිංචිය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දීම<br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා පහත දැමීම සහ ආර්ථික ක්‍රියාකාරකම් වේගවත් වීමත් සමගින් 2024 වසරේ ආනයන සියයට 12.1 කින් ඉහළ යාම.<br>තත්‍ය ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 100.3 ක් ලඟා කරගෙන ඇති බැවින් 2024 අයවැය ඇස්තමේන්තුවෙන් සැළකිය යුතු අපගමනයක් නිරීක්ෂණය නොවේ |
| වෙනත් බදු | 97.0 | 100.0 | 122.9 | වෙනත් බදු මගින් ලද ආදායම රු. බිලියන 122.9 දක්වා සියයට 26.7 කින් සැලකියයුතු ලෙස වැඩි වී ඇත. මේ සඳහා මූලික වශයෙන්;<br>- ආනයන ඉහළ යාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 41.9 කින් ඉහළ යාම<br>- කොටස් ගනුදෙනු බදු, ඔට්ටු හා සූදු ක්‍රීඩා බදු හා සුඛෝපභෝගී මෝටර් රථවාහන බද්ද මගින් උපයන ලද ආදායම වැඩිවීම හේතු වී ඇත<br>විදුලි සංදේශ බද්ද මගින් ලද ආදායම පහළ ගොස් ඇත. කෙසේ වුවද, අනෙකුත් බදු මගින් ලද ආදායම රු. බිලියන 22.9 කින් 2024 වාර්ෂික ඇස්තමේන්තුව ඉක්මවා ඇත. |
| බදු නොවන ආදායම | 328.3 | 287.0 | 326.3 | බදු නොවන මූලාශ්‍ර මගින් ලද ආදායම සියයට 0.6 කින් ආන්තිකව පහළ ගොස් ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් රාජ්‍ය ව්‍යාපාර මගින් ලැබෙන ආදායම් හා ලාභාංශ සියයට 45.7 කින්, කුලී ආදායම් සියයට 8.0 කින් සහ අනෙකුත් බදු නොවන ආදායම් සියයට 7.6 කින් පහළ යාම හේතු වී ඇත. කෙසේ වුවද, දඩ, අයකිරීම් හා ගාස්තු සහ පොළී ආදායම් මගින් ලද ආදායම් බදු නොවන ආදායම් ශක්තිමත් කිරීම සඳහා දායක වී ඇත.<br>බදු නොවන ආදායම් මගින් ලද ආදායම 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 113.7 ලඟාකරගෙන ඇත. |
| එකතුව | 3,048.8 | 4,107.0 | 4,030.8 | |

මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී
[(a)] තාවකාලික

**විශේෂ සටහන 2.6 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2024 වසරේ ජනවාරි සිට 2025 වසරේ අප්‍රේල් දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන** | |
| 2025.04.01 | 2025 අංක 2 දරන දේශීය ආදායම් බදු (සංශෝධන) පනත<br>(1) පුද්ගල ආදායම් බදු (PIT) අනුපාත ව්‍යුහය<br>පුද්ගලයෙකු සඳහා ලබා දෙන පුද්ගල ආදායම් බදු සහනය, වසරකට රු. 1,800,000 / - ක් දක්වා ඉහළ නැංවීම සහ පුද්ගලයෙකු සඳහා බදු අය කළ හැකි ආදායම මත අදාළ වන බදු අනුපාත පහත පරිදි සංශෝධනය කිරීම |

පුද්ගල ආදායම් බදු අනුපාත උපලේඛනය

| | වාර්ෂික බදු අයවන ආදායම (රු.) | |
|---|---|---|
| ආන්තික බදු අනුපාතය (%) | පෙර පැවති බදු අනුපාත ව්‍යුහය | වත්මන් බදු අනුපාත ව්‍යුහය |
| 0 | මිලියන 1.2 දක්වා | මිලියන 1.8 දක්වා |
| 6 | මිලියන 1.2 – මිලියන 1.7 | මිලියන 1.8 - මිලියන 2.8 |
| 12 | මිලියන 1.7 – මිලියන 2.2 | - |
| 18 | මිලියන 2.2 – මිලියන 2.7 | මිලියන 2.8 - මිලියන 3.3 |
| 24 | මිලියන 2.7 - මිලියන 3.2 | මිලියන 3.3 - මිලියන 3.8 |
| 30 | මිලියන 3.2 – මිලියන 3.7 | මිලියන 3.8 - මිලියන 4.3 |
| 36 | මිලියන 3.7 ට වැඩි | මිලියන 4.3 ට වැඩි |

| | |
|---|---|
| 2024.04.01 | 2024.03.21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනය<br>- රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු නියම කිරීම. |
| **මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2025.04.01 | 2025.03.27 දිනැති අංක 2429/39 දරන ගැසට් නිවේදනය<br>- යම් දේපලක් බද්දට හෝ කුලියට දීමට අදාල යම් සාධන පත්‍රයක් මත පනවනු ලබන මුද්දර ගාස්තුව, කල්බදු හෝ කුලී ගිවිසුමෙ (කුලී සින්නක්කර ගිවිසුම හැර) සම්පූර්ණ කාලපරිච්ඡේදය අධි මිලද ඇතුළුව ගෙවිය යුතු එකතු කල්බද්දේ හෝ කුලියෙහි, සෑම රුපියල් 1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා, රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම. |
| **2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත** | |
| 2024.01.12 | 2024.01. 12 දිනැති අංක 2366/33 දරන ගැසට් නිවේදනය<br>- 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ 5 වැනි වගන්තියට ආදේශ කිරීම සහ එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ව්‍යුහයන් සංශෝධනය කරමින් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම. |
| 2024.02.02 | 2024.02.02 දිනැති අංක 2369/42 දරන ගැසට් නිවේදනය<br>- රෙගුලාසියෙහි II වන උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමෙ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක නිවැරදි කිරීම. |
| 2024.04.22 | 2024.04.22 දිනැති අංක 2381/16 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සහ 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිංහල පරිවර්තන දෝෂ නිවැරදි කිරීම. |
| 2024.05.29 | 2024.05.29 දිනැති අංක 2386/09 දරන ගැසට් නිවේදනය<br>- රෙගුලාසියෙහි II වන උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමෙ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම. |
| **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත** | |
| 2024.01.01 | 2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත<br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම. |
| **එකතු කළ අගය මත බද්ද (වැට් බද්ද) - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2024.01.01 | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත<br>- ප්‍රධාන අයිතම මත අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම. |
| 2024.01.01 | 2023.12.19 දිනැති අංක 2363/22 දරන ගැසට් නිවේදනය<br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම. |
| 2024.01.01 | 2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත<br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම සහ එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම. |
| | 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත |
| 2024.01.01 | 1) 2002 අක 14 දරන වැට් බදු පනතෙන් බදු නිදහස් කිරීම ඉවත් කිරීමෙ අනපේක්ෂිත බලපෑම වලක්වා ගැනීම, පනතේ පැහැදිලි බව පවත්වා ගැනීම හා 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් හඳුන්වා දී ඇති එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම. |
| 2025.04.11 | 2) භාණ්ඩ වැට් බද්දෙන් නිදහස් කර ඇති බව හෝ ආනයනකරු/ අපනයනකරු වැට් බදු ලියාපදිංචි සීමාවට පහලින් සිටින බව නොසලකා හැර, වාණිජමය අරමුණින් ආනයන/ අපනයන සිදු කරන විට, ස්ථිර වැට් බදු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම. |
| 2025.04.11 | 3) වැට් බද්දෙන් නිදහස් කරන ලද සැපයුම /මිලදී ගැනීම සම්බන්ධයෙන් වැට් බදු වාර්තා ගොනු කිරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම. |

| | |
|---|---|
| 2025.04.11 | 4) දේශීයව නිපදවන දියර කිරි සහ යෝගට් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම. |
| 2025.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි | 5) 2025 ඔක්තෝබර් මස 01 දින සිට නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සිදුකරන සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බදු පැනවීම. |
| 2025.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි | 6) සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) යෝජනා ක්‍රමය 2025 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම. |
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය<br>- ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩවල බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2025.01.11 | 2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශකකරණය මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/42 දරන ගැසට් නිවේදනය<br>- විද්‍යුත් වාහන සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 100 කින් වැඩි කිරීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/04 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සඳහා නිෂ්පාදන බද්ද පැනවීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2024.01.01 | සුරාබදු නිවේදන අංක 04/2023 (2023.12.31 දිනැති අංක 2364/35 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු සඳහා වාර්ෂික උද්ධමන ගැලපීමක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල මත්පැන් සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 01/2024 (2024.01.12 දිනැති අංක 2366/38 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 02/2024 (2024.01.12 දිනැති අංක 2366/39 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 902 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2024.02.01 | සුරාබදු නිවේදන අංක 03/2024 (2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු ගාස්තු හඳුන්වා දීම. |
| 2024.08.14 | සුරාබදු නිවේදන අංක 05/2024 (2024.08.13 දිනැති අංක 2397/22 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 666 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2025.01.11 | සුරාබදු නිවේදන අංක 01/2025 (2025.01.10 දිනැති අංක 2418/42 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව මත්පැන් මත සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| **දුම්කොළ බද්ද - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත** | |
| 2025.04.02 | 2025.04.01 දිනැති අංක 2430/16 දරන ගැසට් නිවේදනය<br>- බීඩී සඳහා අදාළ වන දුම්කොළ බද්ද ඒකකයට රු. 2/- සිට රු. 3/- දක්වා වැඩි කිරීම. |
| **වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/37 දරන ගැසට් නිවේදනය<br>- 2023 වසරේ අයවැය යෝජනා අංක 34.6 (තීරු බදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීම.) අනුව වසර පහක් ඇතුලත වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බැවින් පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 26 ක වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීම. |

| | |
|---|---|
| 2024.03.29 | 2024.03.28 දිනැති අංක 2377/39 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ (SLSFTA) විධිවිධාන අනුව, අයිතම 3,117ක් සඳහා සහනදායී මිල ගණන් යෙදීමට සහ සිංගප්පූරුවෙන් එම භාණ්ඩ ආනයනය කිරීමේදී භාණ්ඩ 595 ක් නිදහස් කිරීම. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2024.01.06 | 2024. 01.04 දිනැති අංක 2365/50 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) ප්‍රකාශයට පත් කිරීම. |
| 2024.09.06 | 2024. 09.05 දිනැති අංක 2400/25 දරන ගැසට් නිවේදනය<br>- 2024.08.12 දිනැති අංක 24/1541/622/002- II දරන අමාත්‍ය මණ්ඩල තීරණ අංක සහ 2024.08.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සෙස් බද්ද සංශෝධනය කිරීම පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්) - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2024.02.01 | 2024.01.12 දිනැති අංක 2366/34 දරන ගැසට් නිවේදනය<br>- වෙළෙඳපොළ අතරමැදියන් සහ වෙළෙඳපොළ ආයතන සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම් සංශෝධනය කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්) - 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත** | |
| 2024.12.23 | 2024.12.22 දිනැති අංක 2415/79 දරන ගැසට් නිවේදනය<br>- රක්ෂණකරුවන් සඳහා අදාළ වන වාර්ෂික ගාස්තු රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරිකයෙන් සියයට 0.125 සිට සියයට 0.2 දක්වා වැඩි කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2024.01.06 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 06/2023 (2024.01.04 දිනැති අංක 2365/51 දරන ගැසට් නිවේදනය)<br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,222 ක රේගු ආනයන තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහනේ (TLP) "6" කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් දෙවන වාරිකය ඉවත් කිරීම. |
| 2025.01.28 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2025 (2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනය)<br>- මෝටර් රථ ආනයනය සඳහා සියයට 20 හෝ සියයට 20 ක නිශ්චිත තීරු බදු අනුපාතයක් සමඟ (මිශ්‍ර තීරු බදු අනුපාතය) රේගු ආනයන බද්දක් පැනවීම. |
| 2025.04.29 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2025 (2025.04.28 දිනැති අංක 2434/02 දරන ගැසට් නිවේදනය)<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක (NSD) නිර්මාණය කිරීම. |
| **රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)** | |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/43 දරන ගැසට් නිවේදනය<br>- මෝටර් රථ ආනයනය සඳහා ආනයන බදු මත අධිභාරයක් පැනවීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/03 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක (NSD) සඳහා අධිභාරයෙන් සියයට 50ක් පැනවීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2024.01.02 | 2024.01.02 දිනැති අංක 2365/04 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි මස 02 වැනි දින සිට 21 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/- ක බදු සහනයක් සැලසීම. |

| | |
|---|---|
| 2024.01.08 | 2024.01.07 දිනැති අංක 2365/84 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.02.20 | 2024.02.19 දිනැති අංක 2372/06 දරන ගැසට් නිවේදනය<br>- බඩ ඉරිඟු, උඳු සහ මුං ඇට ආනයනය මත පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම හා කව්පි සහ කුරක්කන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු.70/- සිට රු. 300/- දක්වා වැඩි කිරීම. |
| 2024.03.02 | 2024.03.01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනය<br>- 2024 අප්‍රේල් මස 11 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/- ක බදු සහනයක් සැලසීම. |
| 2024 03.27 | 2024.03.26 දිනැති අංක 2377/17 දරන ගැසට් නිවේදනය<br>- උත්සව සමය පිළිබඳ සලකා අනෙකුත් ළූණු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 10/- හා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ සහනදායී බදු අනුපාතයක් අය කිරීම සහ 2024.01.02 සිට 2024.01.21 දක්වා සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/- ක බදු සහනයක් සැලසීම. |
| 2024 05.18 | 2024 05.17 දිනැති අංක 2384/31 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා අයිතම 34ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම. |
| 2024.07.31 | 2024.07.31 දිනැති අංක 2395/32 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලුණු ආනයනය මත තීරුබදු නිදහස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම සහ භාණ්ඩ 6ක් සඳහා වලංගු කාලය දීර්ඝ කිරීම. |
| 2024.10.03 | 2024.10.02 දිනැති අංක 2404/19 දරන ගැසට් නිවේදනය<br>- දේශීය අස්වනු නෙලීමේ කාලය සැලකිල්ලට ගනිමින් අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළවෙලින් කිලෝ ග්‍රෑමයකට රු.60/-ක් හා රු.30/- ක් වැඩි කිරීම. |
| 2024.10.14 | 2024.10.14 දිනැති අංක 2406/02 දරන ගැසට් නිවේදනය<br>- මාළු, උම්බලකඩ, පරිප්පු, මැන්ගුස් සහ කිවි පලතුරු ආනයනය සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය සහ දේශීය ටින් මාළු කර්මාන්තයේ භාවිතය සඳහා මැකරල් මාළු ආනයනය සඳහා තීරු බදු සහනය 2024 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම. |
| 2024.11.02 | 2024.11.01 දිනැති අංක 2408/15 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා ආනයනික සුදු සීනි මත රු. 50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.12.01 | 2024.11.30 දිනැති අංක 2412/38 දරන ගැසට් නිවේදනය<br>- ආනයනික අර්තාපල් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ 2024 දෙසැම්බර් 31 දක්වා ආනයනික ලොකු ළූණු සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 30/- සිට රු. 10/- දක්වා අඩු කිරීම. |
| 2025.01.01 | 2024.12.31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය<br>- අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයනික අයිතම 63 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2025 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම. |
| 2025.01.28 | 2025.01.27 දිනැති අංක 2421/03 දරන ගැසට් නිවේදනය<br>- 2025 මාර්තු මස 03 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2024.01.11 | 2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.01.11 දිනැති අංක 2366/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ වර්ග ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම. |

| | |
|---|---|
| 2024.02.07 | 2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.07 දිනැති අංක 2370/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 12(අ) රෙගුලාසිය සංශෝධනය කිරීම මගින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර දී ඇති කාලය 2024.08.31 දක්වා දීර්ඝ කිරීම.* |
| 2024.02.19 | 2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.19 දිනැති අංක 2372/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යාවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම.** |
| 2024.02.29 | 2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.28 දිනැති අංක 2373/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- පිළිගැනීම් මත ලේඛන (DA) සහ ගෙවීම් මත ලේඛන (DP) ගෙවීම ක්‍රමවල පූර්ව අනුමත කිරීමේ අවශ්‍යතාවයට අදාළ 2022 අංක 07 දරන ආනයන පාලන රෙගුලාසිවල (2024.05.06 දින අංක 2278/21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 6 දරන රෙගුලාසිය ඉවත් කිරීම. |
| 2024.03.19 | 2024 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.03.19 දිනැති අංක 2376/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.04.08 | 2024 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.04.08 දිනැති අංක 2379/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC), ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සඳහා 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති උඳු මෙට්‍රික් ටොන් 2,000 ක් ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සංචාරක අංශය සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- තෝරාගත් ආනයනික භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති නියම කිරීම. |
| 2024.06.06 | 2024 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.06 දිනැති අංක 2387/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යාවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දින අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති පුවක් ආනයනය කිරීමට අවසර දීම. ** |
| 2024.06.28 | 2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.28 දිනැති අංක 2390/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- ආහාරයට ගත හැකි තෝරාගත් ධාන්‍ය සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම සහ මිනිසුන් රහිත ගුවන් යාත්‍රා සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම. |

| | |
|---|---|
| 2024.07.18 | 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.07.18 දිනැති අංක 2393/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, යහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.08.21 | 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (2024.08.21 දිනැති අංක 2398/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවල අර්ථය තුළ බලයලත් පුද්ගලයන්ට විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.09.11 | 2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.09.11 දිනැති අංක 2401/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කරන ලද ගිවිසුම් සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ එකලස් කිරීමේ ව්‍යාපෘති සඳහා නවතම අර්ධ වශයෙන් එකලස් කළ (SKD) කට්ටල ආනයනය කිරීමට අවසර දීම. ** |
| 2024.12.04 | 2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.04 දිනැති අංක 2413/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය, 2024 දෙසැම්බර් 20 වන දින දක්වා ඉවත් කිරීම.* |
| 2024.12.18 | 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.18 දිනැති අංක 2415/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන අයිතම ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.* |
| 2024.12.24 | 2024 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.24 දිනැති අංක 2416/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2024.12.04 දිනැති අංක 2413/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සිදු කරන ලද සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම, 2025 ජනවාරි 10 වන දින දක්වා අඛණ්ඩව සිදු කිරීම.* |
| 2025.01.28 | 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.* |
| 2025.02.01 | 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, සපෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම. |
| 2025.03.19 | 2025 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.03.19 දිනැති අංක 2428/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- භාවිතා කළ මෝටර් රථ සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීමට සියලුම රටවල් සඳහා බලයලත් පරීක්ෂකවරයෙකු ලෙස බියුරෝ වෙරිටාස් ආයතනය පත් කිරීම, සහ අපනයන රටෙහි බැංකුවේ මුද්‍රාව (2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 5 දරන රෙගුලාසිය ප්‍රකාරව අවශ්‍යවන) නොමැතිව ලැබුණු මෝටර් රථවල අපනයන පරීක්ෂණ සහතික මාර්ගගත සත්‍යාපනය හරහා නිකුත් කිරීමට බලපත්‍ර බැංකුවලට බලය පැවරීම. |

| | |
|---|---|
| 2025.04.29 | 2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.04.19 දිනැති අංක 2434/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2023.01.01 දිනැති අංක 2312/77 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටවූ අයිතම ලැයිස්තුව සමාලෝචනය කර තෝරාගත් අයිතම එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සහ ඕනෑම රටක ලියාපදිංචි නොකළ (නවතම) විද්‍යුත් යතුරුපැදි ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2024.02.01 | 2024.02.01 දිනැති අංක 2369/27 දරන ගැසට් නිවේදනය<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින්, ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා වන ඇ.ඩො.30 ක සහනදායි අනුපාතය දීර්ඝ කිරීම. |
| 2024.03.07 | 2024.03.06 දිනැති අංක 2374/19 දරන ගැසට් නිවේදනය<br>- 2024 මාර්තු මස 07 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර තුනක පමණ කාලයක් සඳහා ඇ.ඩො. 60 ක අපගමන බද්ද වෙනුවට. මගී යාත්‍රා ප්‍රවාහනය මගින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.ඩො. 5 ක් ලෙස සහනදායි අනුපාතයක් සහ මගී නෞකාවක් මගින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.ඩො. 20 ක් ලෙස සහනදායි අනුපාතයක් ප්‍රදානය කිරීම. |
| 2025.01.31 | 2025.01.31 දිනැති අංක 2421/30 දරන ගැසට් නිවේදනය<br>- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, අපගමන බදු නිදහස් කිරීමේ කාලය ජාත්‍යන්තර ගුවන් සේවාවක් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර තුනක කාලයක් සම්පූර්ණ වන දින හෝ 2025.12.28 යන දින දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා දීර්ඝ කිරීම.<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා ඇ.ඩො. 30 ක සහනදායි අපගමන බදු අනුපාතය දීර්ඝ කිරීම. |
| **ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත** | |
| 2025.04.01 | 2025.04.01දිනැති අංක 2430/14 දරන ගැසට් නිවේදනය<br>- පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු සඳහා ගෙවිය යුතු වත්මන් බදු අනුපාතය 2025 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා වසර තුනක් සඳහා දීර්ඝ කිරීම. |
| **මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2024.01.24 | 2024.01.24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය<br>- 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි පිහිටුවීම සහ මෝටර් රථ ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය තව දුරටත් දීර්ඝ කිරීම (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විද්‍යුත් මෝටර් රථවල බදු රහිත සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා වැඩි කිරීම). |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/41 දරන ගැසට් නිවේදනය<br>- විද්‍යුත් මෝටර් රථ හැර, සෑම ඉන්ධන කාණ්ඩයකම මෝටර්රථ සඳහා වන සුඛෝපභෝගී බදු සීමාව රු. මිලියන 1.5 කින් වැඩි කිරීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/05 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විද්‍යුත් බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සඳහා සුඛෝපභෝගී බද්ද පැනවීම. |

* දැනට බලනොපැවැත්වේ.

** දැනට වලංගු නොවේ.

2.4 අභියෝග හා අනාගත ඉලක්ක

1. අඛණ්ඩ ආර්ථික ප්‍රකෘතිය සඳහා සහය දැක්වීම සඳහා පවතින සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාවත අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සමෘද්ධිය ලබා දෙන සහ යහපැවැත්ම වැඩි කරන සියල්ල ඇතුළත්, තිරසාර සහ ශක්තිමත් වර්ධන මාවතක් ස්ථාපිත කිරීම.

2. තිරසාර සහ ඇතුළත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා බදු ප්‍රතිපත්ති, බදු පරිපාලනය සහ නීති සම්පාදනය ආවරණය වන පරිදි ඵලදායී මූල්‍ය ප්‍රතිසංස්කරණ සකස් කිරීම.

3. 2025 වසරේ දී සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ලබා ගැනීම සහ එය මධ්‍ය කාලීනව පවත්වා ගෙන යාම සඳහා රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම.

4. බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ප්‍රධාන ආදායම් එකතු කිරීමේ ආයතනවල පද්ධති සහ ක්‍රියාවලි ඩිජිටල්කරණය ඇතුළු ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

5. ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සහ ඉදිරි කාලය තුළ රට දෙවන ණය පැහැර හැරීමක් අත්විඳීම වැළැක්වීම සඳහා ඉහළ ආර්ථික වර්ධනයක් සහිත තරඟකාරී, අපනයන-අභිමුඛ, හරිත සහ ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීමට නව ප්‍රතිපත්ති අපේක්ෂා කෙරේ.

.....................................................

ආචාර්ය එම්.කේ.සී .සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්

# 03 වන පරිච්ඡේදය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

## 3.0 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | සත්‍ය 2024 රු. | 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | 1,028,555,191 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | 1,028,555,191 | |
| | මුළු ආදායම් ලැබීම් (අ) | | | 1,028,555,191 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 85,915,000 | 70,495,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 268,894 | 189,496 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 4,039,335 | 2,987,148 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **90,223,229** | **73,671,644** | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **90,223,229** | **1,102,226,834** | |
